
# විභාෂා

2012 දෙසැම්බර් - 2013 ජනවාරි | විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශනයකි | දෙවන වෙළුම | හත්වන කලාපය

# බැංකු ලියවිලි ඉංග්‍රීසියෙන් පමණක් එපා

## මානව හිමිකම් කොමිසමට පැමිණිල්ලක්



**සඳමාලි සෙනෙවිරත්න**

රාජ්‍ය බැංකු, පෞද්ගලික බැංකු සහ මූල්‍ය සමාගම් බොහෝ විට තම ණය ගිවිසුම් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සකස් කර ඇති අතර ඒවා සිංහල හා දෙමළ භාෂාවන්ගෙන් සකස් නොකිරීම සම්බන්ධයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත මෙම දෙසැම්බර් මස 20 වැනි දා පැමිණිල්ලක් ඉදිරිපත් කළේ ය.

මෙම බැංකු ලියවිලි ඉංග්‍රීසියට පමණක් සීමා වීම හේතුවෙන් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වගන්තියේ සඳහන් මූලික අයිතිවාසිකම් උල්ලංඝනයන් සිදුවන බැවින් බැංකු ක්ෂේත්‍රය තුළ ත්‍රෛභාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස කොමිෂන් සභාවෙන් පැමිණිලි පාර්ශ්වය ඉල්ලා සිටියේ ය.

*11 පිටුවට*

## භාෂා අයිතිය තේමා කරගත් ශිෂ්‍ය රචනා තරඟයක්

භාෂා අයිතිය මූලික කරගනිමින් පැවැත්වෙන රචනා තරඟයක් සඳහා උතුරු නැගෙනහිර පළාත්වල අ.පො.ස සා/පෙළ හා උ/පෙළ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගෙන් අයැදුම්පත් කැඳවීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රජා වැඩසටහන් අංශය කටයුතු යොදා තිබේ.

භාෂාව සහ මිනිස්කම තේමා කරගනිමින් ලියනු ලබන රචනය වචන 750 - 1000 ක අතර විය යුතු ය. එය ඒ 4 (A4) ප්‍රමාණයේ කඩදාසි වල තනි පැත්තක පමණක් ලිවිය යුතු අතර රචනා භාරගන්නා අවසාන දිනය 2013 මාර්තු 10 වන දිනයයි. මේ සඳහා යෝජිත මාතෘකා පහත සඳහන් වෙයි.

1. ශ්‍රී ලංකාවේ ජනවාර්ගික ප්‍රශ්නය සහ භාෂා අයිතිවාසිකම්.
2. භාෂා අයිතීන් ද මානව හිමිකම් වේ.
3. භාෂා අයිතීන් සහ ජනවර්ගයන් අතර අවබෝධය.
4. සංස්කෘතික විවිධත්වයේ මූලිකාංගයක් ලෙස භාෂා අයිතීන්.
5. භාෂා අයිතීන්ට ගරු කිරීම.

දිස්ත්‍රික් මට්ටමින් තෝරා ගන්නා ඉතාමත් සාරවත් රචනා අතරින් පස්වැනි ස්ථානය දක්වා වටිනා ත්‍යාග පිරිනැමීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කටයුතු යොදා ඇත.

ඉදිරිපත් කිරීම සහ වැඩිදුර විස්තර, විමසීම සඳහා තම ලිපියනය ද සහිතව පහත ලිපිනයට යොමු කළ යුතු ය.

වැඩසටහන් භාර නිලධාරී,
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
105. 05 වැනි පටුමග,
කොළඹ - 03

***වැඩි විස්තර සඳහා 13 වැනි පිටුව බලන්න.***





**සුළුතර ජාතිකත්ව ප්‍රජාවන්හි භාෂා අයිතීන් ප්‍රවර්ධනය කිරීම සඳහා පැවැත්වෙන වැඩසටහන යටතේ භාෂා සමිති නියෝජිතයන්ගේ අත්දැකීම් හුවමාරු කරගැනීමේ වැඩසටහනක් පසුගිය දෙසැම්බර් මස 11, 12 සහ 13 යන දිනයන්හිදී අම්පාර, දිස්ත්‍රික්කයේ පානම ප්‍රදේශයේදී ක්‍රියාත්මක විය.**

**එම වැඩසටහනට සහභාගි වූ යාපනය, මන්නාරම හා වව්නියාව යන ප්‍රදේශයන්හි භාෂා සමිති නියෝජිතයන් අම්පාර දිස්ත්‍රික්කයේ නියෝජිතයන් සමග තම අත්දැකීම් හුවමාරු කරගත් අයුරු මෙම ඡායාරූපයෙන් දැක්වේ.**

## 2013 දැයට කිරුළ ප්‍රදර්ශන භූමියේ

### ජාතික භාෂා කුසලතාවයට සම්මාන පිරිනැමේ

2013 වසරේ පැවැත්වෙන දැයට කිරුළ ප්‍රදර්ශනයේ දී රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ඉතා ඉහළින් ම ක්‍රියාත්මක කරන ප්‍රදර්ශන කුටි තුනක් තෝරා ඒ සඳහා "ජාතික භාෂා කුසලතාවය" නම් වූ සම්මානය පිරිනැමීමට රාජ්‍ය භාෂා කොමිසම පියවර ගෙන ඇති බව එහි සභාපති නීතිඥ නිමල් ආර්. රණවක මහතා විභාෂා පුවත් හසුන සමග කළ සාකච්ඡාවේදී පැවසීය.

මේ අනුව ප්‍රදර්ශන කුටි පිළිබඳ විස්තර ආදිය ද සියලුම භාණ්ඩ, පිළිබඳ විස්තරද භාෂා තුනෙන් ම ඉදිරිපත් කිරීමට ප්‍රදර්ශකයන් පියවර ගත යුතු ය.

මෙවැනි පියවරක් ගැනීමට හේතු වූයේ පසුගිය වසරේ පැවති දැයට කිරුළ ප්‍රදර්ශනයේ දී පැවැත්වූ භාෂා සමීක්ෂණය ඉවහල් කරගෙන බව ද රණවක මහතා වැඩිදුරටත් පැවසීය.

# ලබන වසරේ සිට ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට 'ද්වි භාෂා තනතුරක්'

***සඳමාලි සෙනෙවිරත්න***

රාජ්‍ය පරිපාලන අමාත්‍යංශය, රාජ්‍ය භාෂා කොමිසම එක්ව පැවති සාකච්ඡාවක ප්‍රතිඵලයක් වශයෙන් ලබන වසරේ සිට 'ද්වි භාෂා තනතුරක්' නම් කෙරේ. මේ පිළිබඳ කරුණු පැහැදිලි කරමින් රාජ්‍ය භාෂා කොමිසමේ සභාපති නීතිඥ නිමල් ආර් රණවක මහතා වැඩිදුරටත් මෙසේ පැවසීය. "ප්‍රථම වතාවට ශ්‍රී ලංකාවේ මෙම තනතුරු ඇති කිරීමට රාජ්‍ය පරිපාලන ලේකම්වරයා ඇතුළු නිලධාරීන් තීරණය කළා. ශ්‍රී ලංකාවේ ද්විභාෂා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 71 හඳුනාගෙන තියෙනවා. මේ කොට්ඨාශ 71 තුළින් 'ද්වි භාෂා තනතුර' ඇති කිරීමට පියවර ගත්තා. පසුගිය දා උපාධිධාරීන් 50,000 කට පත්වීම් ලබා දීමට රජය කටයුතු කළා. ඔවුන් අතරින් මෙම තනතුරට සුදුසු පුද්ගලයන් තෝරීමට මෙම සාකච්ඡාවේදී තීරණය කළ බව" රාජ්‍ය භාෂා කොමිසමේ සභාපති නිමල් ආර්. රණවක මහතා පැවසී ය.

## මිල්ලනිය දෙමළ භාෂා පාඨමාලාව සාර්ථකව නිමා කෙරේ

කළුතර දිස්ත්‍රික්කයට අයත් මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තරුණ තරුණියන් සඳහා නොමිලේ පවත්වන ලද දෙමළ භාෂා පුහුණු පාඨමාලාවේ පළමු පියවර පසුගියදා සාර්ථකව නිමාවට පත්විය. 2012 වසරේ පළමු කණ්ඩායම ලෙස මෙම පාඨමාලාවට සම්බන්ධ වූ ශිෂ්‍ය කණ්ඩායම විසිර යාමේ උළෙල පසුගියදා කන්නන්කුඩාව වින්රෝ උත්සව ශාලාවේදී මහත් උත්කර්ශවත් අන්දමින් සිදුවිය.

මෙම පාඨමාලාව මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් විමල් ගුණතුංග මහතාගේ උපදේශකත්වය යටතේ මිල්ලනිය ප්‍රජා වතු යටිතල පහසුකම් ප්‍රවර්ධන නිලධාරී වනරාජ මහතා ස්වේච්ඡාවෙන් මෙහෙයවනු ලබයි.

විසිරයාමේ උළෙලෙහි ප්‍රධාන අමුත්තා ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රී ජානක ප්‍රියන්ත බණ්ඩාර මහතා සහභාගි වූ අතර නැටුම් ගැයුම් හා නාට්‍ය දර්ශන ආදියෙන් උත්සවය විචිත්‍රවත්ව තිබිණි ප්‍රදේශයේ රාජ්‍ය ආයතන හා ප්‍රජා සංවිධාන රැසක නියෝජිතයෝද, ප්‍රදේශවාසීහු විශාල පිරිසක්ද උත්සවයට සහභාගි වූහ.

## ගල්මැටියාවේ ඉංග්‍රීසි පාලනයක්

ගල්මැටියාව ග්‍රාමෝදය සෞඛ්‍ය මධ්‍යස්ථානයේ නාම පුවරුව ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සඳහන් වී තිබීම සම්බන්ධයෙන් එම ප්‍රදේශවල ජනතාව දැඩි අප්‍රසාදය පළ කරති. ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයට අයත් තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගල්මැටියාව උතුර ග්‍රාම සේවා වසමට අයත් මෙම සෞඛ්‍ය මධ්‍යස්ථානයේ ඉංග්‍රීසියෙන් පමණක් ඇති නාම පුවරුව පිළිබඳව ප්‍රදේශවාසීන් බලධාරීන් දැනුවත් කළ ද තවමත් ඊට විසඳුමක් ලැබී නොමැත. ප්‍රදේශයේ ජනතාව වගකිවයුත්තන්ගෙන් ඉල්ලා සිටින්නේ වහාම මෙම නාම පුවරුව සිංහල සහ දෙමළ භාෂාවලින් සඳහන් කර දෙන ලෙසයි.

## ලිපි ලේඛන දෙමළෙන් පමණයි

ත්‍රිකුණාමල නගර හා කඩවත් ප්‍රාදේශීය සභාවේ සියලු කටයුතු දෙමළ භාෂාවෙන් පමණක් සිදු කෙරෙන අතර මෙම ප්‍රදේශයේ සිංහල ජනතාව මේ හේතුවෙන් දැඩි දුෂ්කරතාවයකට පත්ව සිටිති.

ලිපි ලේඛණ හා නිවේදන සියල්ල දෙමළ භාෂාවෙන් පමණක් නිකුත් කිරීම පිළිබඳව සිංහල ජනයා විසින් ජනාධිපතිවරයාට පවා දන්වා ඇතිමුත් තවමත් ඒ සඳහා පිළියමක් ලැබී නොමැත.

මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සිංහල පවුල් 1200 ක් සහ දෙමළ මුස්ලිම් පවුල් 5000 ක් පමණ ජීවත්ව සිටිති. තමන් මුහුණ දෙන මෙම ප්‍රශ්න පිළිබඳ වගකිවයුත්තන්ගේ අවධානය යොමු වනු ඇතැයි ඔවුහු අපේක්ෂා කරති.

## රාජ්‍ය නිලධාරීන්ට සිංහල, දෙමළ ඉගැන්වීමට ගුරුවරුන් පුහුණු කෙරේ

දෙවෙනි භාෂාවක් ලෙස රජයේ නිලධාරීන්ට සිංහල හා දෙමළ භාෂා ඉගැන්වීම සඳහා සෑම පළාතක්ම නියෝජනය වන පරිදි ගුරුවරුන් 1976 දෙනෙකු ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයෙන් පුහුණු කර ඇත. රාජ්‍ය නිලධාරීන්ගේ භාෂා ප්‍රවීණතා වර්ධන පාඨශාලාවල ඉගැන්වීම සඳහා මෙම ගුරුවරුන් යොමු කර ඇතැයි එම ආයතනය පවසයි. මේ හැර ඉංග්‍රීසි භාෂා පුහුණුව සඳහා ද විශේෂ වැඩපිළිවෙලක් යොදා ඇත. ඒ යටතේ රාජ්‍ය නිලධාරීන් 150 කට ආසන්න පිරිසකට ඉංග්‍රීසි භාෂාව පිළිබඳ නේවාසික පුහුණුවක් ලබාදී ඇතැයි ජාතික භාෂා අධ්‍යාපන සහ ආයතනයෙහි සභාපතිනී සීතා විතානආරච්චි ප්‍රකාශ කළාය.

## භාෂා අයිතිය පිළිබඳ ගැටලුවක් ද? 1956 අමතන්න

ද්විභාෂා අයිතිය සම්බන්ධ ගැටලු කඩිනමින් විසඳා ගැනීමට මගපෙන්වන ක්ෂණික දුරකතන අංකයක් හඳුන්වා දීමට ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යංශය කටයුතු යොදා ඇත. 1956 නමැති මෙම ක්ෂණික දුරකතන අංකය හඳුන්වා දීම පසුගිය 28 දා සිදුවිය.

කාර්යාල වේලාවන්හි දී මෙම මධ්‍යස්ථානය විවෘතව පවතින බවත් රජයේ කාර්යාලයකින් තම කාර්යයන් ඉටුකර ගැනීමේ දී භාෂාව නිසා ගැටලුවක් ඇති වන්නේ නම් ඒ බව මෙම මධ්‍ය ස්ථානයට (1956) පැමිණිලි කිරීමෙන් ඊට විසඳුම් ලබා ගත හැකි බවත් ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යංශයේ පැවැති මාධ්‍ය හමුවකදී අමාත්‍යංශ නිලධාරිහු ප්‍රකාශ කළහ.

## භාෂා පිළිවෙත කැඩුවොත් නඩු

***සඳමාලි සෙනෙවිරත්න***

ලබන දෙසැම්බර් 31 වන දිනෙන් පසුව මඟී ගමනාන්ත පුවරු සහ රජයේ බැංකු ආයතන සියල්ලෙහි ත්‍රෛභාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම අනිවාර්ය බවත් එසේ නොකරන්නේ නම් ඔවුන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට කටයුතු සලසා ඇති බවත් රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ සභාපති නීතිඥ නිමල් ආර්. රණවක මහතා විභාෂා පුවත් හසුන වෙනුවෙන් කළ විමසුමක දී කියා සිටියේ ය. මේ සම්බන්ධව පොලිස්පතිතුමා ඇතුළු බලධාරීන් සමඟ සාකච්ඡා කොට ඇති බවත් ඒ මහතා වැඩිදුරටත් පැවසී ය.

## ඔබේ භාෂා අයිතිය වෙනුවෙන්

පොලිස් ස්ථානයකදී ඔබගේ භාෂාවෙන් ප්‍රකාශ සටහන් කර ගැනීමේ හැකියාවක් පොලිස් ස්ථානය තුළ සිටින නිලධාරීන්ට නොමැති නම් එය ඔබගේ භාෂාවෙන් (සිංහල හෝ දෙමළ) කොළයක සටහන් කර තොරතුරු පොතේ අලවන ලෙස ඔබට ඉල්ලා සිටිය හැක.

තම භාෂා අයිතිවාසිකම් උල්ලංඝණය වී ඇති ඕනෑම පුරවැසියකුට සහනය පතා රාජ්‍ය භාෂා කොමිසන් සභාව වෙත පැමිණිලි ඉදිරිපත් කළ හැකිය.

**පැමිණිලි සහ විමර්ශන සඳහා සෘජු දුරකථන**

**0112878687**

**රාජ්‍ය භාෂා කොමිෂන් සභාව,**
සභාපති/ලේකම්,
හතරවන මහල, භාෂා මන්දිරය,
341/7, කෝට්ටේ පාර,
රාජගිරිය.
ඊමේල් : olc@sltnet.lk

# භාෂා අයිතිවාසිකම්
# මානව හිමිකම්ද වේ



> "වර්ථමානයේ බොහෝ රටවල් මානව හිමිකම් ප්‍රකාශනයට හා ජාත්‍යන්තර ගිවිසුම් වලට අත්සන් කොට ඇත්තේ විදේශ ආධාර ලැබීමට එය අවශ්‍ය කොන්දේසියක් වන නිසා මිස අව්‍යාජ කැපවීමකින් නොවේ. ශ්‍රී ලංකාව ද මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයට අත්සන් තබා ඇති රටකි. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පිළිග නු ලැබ ඇති එක් මූලික අයිතිවාසිකමක් වන්නේ "භාෂා අයිතීන්" ය."

***නදීශා පවුලිස්***

දෙසැම්බර් 10 වන දින ලොව පුරා ජාත්‍යන්තර මානව හිමිකම් දිනය සැමරේ. මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය එක්සත් ජාතීන් විසින් සම්මත කිරීමට යෙදුනේ 1948 දීය. රටවල් 48ක් ඊට පක්ෂව ඡන්දය දුන් අතර කිසිදු රටක් විරුද්ධ නොවීය. නමුත් රුසියාව, පෝලන්තය, වර්ණභේද වාදය පැවති දකුණු අප්‍රිකාව සහ සවුදි අරාබිය ඡන්දය දීමෙන් වැලකී සිටියහ. 1978 වනවිට බහුතරයක් රටවල් මෙම ප්‍රකාශනයට අත්සන් කොට තිබුණු අතර ජාත්‍යන්තර නීතිය යටතේ නෛතික බලයක් ඊට හිමිවිය.

මානව හිමිකම් යනු මොනවාද? ඒවා යමෙකුට අවශ්‍ය වන්නේ ඇයි? මානව හිමිකම් නොතිබී නම් ලෝකය කෙබඳු වනු ඇති ද?

පැරණි මායා හා ඊජිප්තු වැනි ශිෂ්ඨාචාරයන් කෲර වූ අතර මානව හිමිකම් ඒවායෙහි නොපැවතුනු තරම්ය. දිලිඳු ගැමි පවුල්වල මිනිසුන් වහලුන් ලෙස විකුණනු ලැබූ අතර ඔවුනට සලකනු ලැබුයේ සතුන්ටත් අන්ත ලෙසය. තම ස්වාමි පුරුෂයන් මියගිය කාන්තාවන්ට ඔවුන්ගේ දරසෑයට පැන දිවිනසා ගැනීමට සිදුවිය. චර්ම රෝගයක් වැළඳුනු මිනිසකුට සිදුවූයේ නගරයෙන් ඉවත්ව වනගත වීමටය. ළමයින් වෙළඳ භාණ්ඩ මෙන් විකිණීම හා මිලදී ගැනීම සිදුවිය. මෙම තත්වයෙන් මිදීමට මානව සංහතියට වසර දහස් ගණනක් ගතවිය. වර්තමානයේ වුවද ඇතැම් විට මෙවැනි දේ සිදුවූව ද එසේ වන්නේ නීති විරෝධී ලෙසය. උදාහරණයක් ලෙස ළමයින් විකිණීම තවමත් සිදු වුවද එය අපරාධයක් වන අතර එසේ විකුණා අසුවුවහොත් බරපතල දඬුවම් විඳීමට සිදුවේ.

වර්තමානයේ බොහෝ රටවල් මානව හිමිකම් ප්‍රකාශනයට හා ජාත්‍යන්තර ගිවිසුම් වලට අත්සන් කොට ඇත්තේ විදේශ ආධාර ලැබීමට එය අවශ්‍ය කොන්දේසියක් වන නිසා මිස අව්‍යාජ කැපවීමකින් නොවේ. ශ්‍රී ලංකාව ද මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයට අත්සන් තබා ඇති රටකි. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පිළිගනු ලැබ ඇති එක් මූලික අයිතිවාසිකමක් වන්නේ "භාෂා අයිතීන්" ය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(2) වගන්තිය මෙසේ ප්‍රකාශකොට සිටී. "කිසිම පුරවැසියෙකු වර්ගය, ආගම, භාෂාව ද, කුලය, ස්ත්‍රී පුරුෂ භේදය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන හේතු මත හෝ ඉන් කවර හෝ හේතුවක් මත හෝ වෙනස්කමකට හෝ විශේෂයකට හෝ භාජනය නොවිය යුත්තේ ය."

මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශණයේ 2වැනි වගන්තියට එය බෙහෙවින්ම සමාන වේ. එය මෙපරිද්දෙන් වේ. "දෙවන වගන්තිය : ජාති, වංශ, වර්ණ, ස්ත්‍රී පුරුෂ භාවය, භාෂාව, ආගම්, දේශපාලන ආදී කවර භේදයක් හෝ සමාජ, ජාතික, දේපළ, උපත ආදී කවර තත්ත්වයක විශේෂයක් හෝ නොමැතිව මේ ප්‍රකාශනයේ සඳහන් සියලු හිමිකම්වලට හා ස්වාධීනත්වයන්ට සෑම පුද්ගලයකුම උරුම වන්නේ ය."

එබැවින් භාෂා අයිතිවාසිකම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අන්තර්ගත මූලික මානව හිමිකම් වේ. විශේෂයෙන්ම 13 වන සංශෝධනයෙන් සහ ශ්‍රී ලංකාවේ විවිධ නෛතික අණපනත් මගින් මෙම තත්ත්වය වඩාත් තහවුරු කරනු ලැබ තිබේ. 1956 රාජ්‍ය භාෂා පනත, 1620/27 ජූනි විශේෂ ගැසට් පත්‍රය, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ යනාදිය මීට උදාහරණ වේ. මෙම අගයයන් නගා සිටුවීම පිණිස ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය ලෙස අමාත්‍යාංශයක් ද ඇතිකොට තිබේ. මෙම අමාත්‍යාංශය යටතේ පවත්නා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව රාජ්‍ය භාෂා කොමිසම සහ ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය යනා දී ආයතනික ව්‍යුහයන් මගින් තම මෙහෙවර ඉටු කිරීම අපේක්ෂා කෙරේ. මෙම වැදගත් ආයතනයන්හී නිල පැවරුම් මගින්, ශ්‍රී ලංකාව ගැටුම් වලින් තොරව සමාජ සමගියේ දිශානතියට ගමන් කිරීමට නම් භාෂාමය බාධකයන් ජය ගතයුතු බව පොදුවේ පිළිගැනේ.

එබැවින් භාෂා අයිතිවාසිකම් යනුවෙන් සැබවින්ම අදහස් වන්නේ කුමක් ද?

ශ්‍රී ලාංකීය පසුබිම තුළ මූලික වශයෙන් භාෂා අයිතිවාසිකම් යනුවෙන් අදහස් වන්නේ ඕනෑම ශ්‍රී ලාංකිකයෙකු හට තමාගේ තේරීම වන රාජ්‍ය භාෂාවකින් එනම් සිංහලෙන් හෝ දෙමළෙන් රාජ්‍ය හා පොදු ආයතනයන් සමග ගනුදෙනු කිරීමට ඇති අයිතියයි.

එයින් අදහස් වන්නේ මහජන ආයතන වල දැන්වීම් පුවරු, මහජන ප්‍රවාහන සේවාවන් හා මහජන උපයෝගීතා පහසුකම්, මෙම ස්ථානයන්ගෙන් ලැබෙන තොරතුරු සහ ලියකියවිලි මෙන්ම මෙම ආයතනයන්හී නිලධාරීන්ගෙන් ලැබෙන සහයෝගය යනාදිය ඕනෑම අයෙකු හට සිංහල හෝ දෙමළ වශයෙන් වන තමන්ගේම වූ භාෂාවෙන් ලබාගත හැකිවිය යුතු බවයි. මේවා සපුරාලිය යුතු අවම නිල අවශ්‍යතාවයන් වේ.

භාෂා අයිතීන්ට ගරු කිරීම ප්‍රවර්ධනය කළ යුතුව ඇත.

සාමාන්‍ය පුරවැසියකු ට භාෂා අයිතීනට ගරු කිරීමට සහය වියහැකි ආකාරයන් රැසක් ඇත.

- ඔබගේ පළාතේ කඩයක හෝ සුපිරි වෙළඳසැලක පාරිභෝගික ද්‍රව්‍යවල දැන්වීම් සහ මිල ගණන් එක් භාෂාවකින් පමණක් තිබේ නම් පරිවර්තනයක්ද එහි දක්වන ලෙස ආචාරශීලී ලෙස ඉල්ලා සිටිය හැකිය.
- පළාතේ පාසල් පුස්තකාලයක හෝ පෙර පාසලක දැන්වීම් පුවරු හෝ ෆෝරම යනාදී ය ඇත්තේ එක් භාෂාවකින් පමණක් නම් එහි පරිවර්තනයක් කරදීම පිණිස පුද්ගලිකව මැදිහත්විය හැකිය.
- රජයේ නිල වෙබ් අඩවිවල දේශීය භාෂාවන්ගෙන් යම් තොරතුරක් නොමැති වන විටක පරිවර්තනයක් ද පල කරන ලෙස ආචාරශීලි ඊමේල් හසුනක් යැවීම කළ හැකිය.
- වඩා බරපතල භාෂා අයිතීන් කඩවීමක දී සහ රජයේ ආයතන සමග කටයුතු කිරීමේ දී අලුතින් පිහිටුවනු ලැබ ඇති 1956 භාෂා Hotline එක හා සම්බන්ධ වෙන්න. එසේත් නැතිනම් මානව හිමිකම් කොමිසම හෝ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව වෙත පැමිණිල්ලක් කළ හැකිය.

ඒවා අපගේ මව්බිමයයි හඳුන්වන මේ ලස්සන රටේ සාමය කැමති පුරවැසියන් ලෙස අපට ගතහැකි සාධනීය පියවරයන්ගෙන් කිහිපයක් පමණි.

# අම්පාරේ ජනමාධ්‍ය හා භාෂා සංගම් කඳවුරු බඳිති

**භාෂා අයිතීන් උල්ලංඝනය වීමේ සිද්ධීන් ජනමාධ්‍ය මගින් හෙළි කිරීම අපගේ අරමුණයි.**



විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය උතුරු නැගෙනහිර පළාත මූලික කරගනිමින් පසුගිය වසරේ ආරම්භ කළ භාෂා අයිතීන් ප්‍රවර්ධන වැඩසටහනෙහි දෙවෙනි අදියර මේ වන විට සාර්ථක ලෙස ගමින් ගම ක්‍රියාත්මක වෙමින් තිබේ. මෙම වැඩසටහන යටතේ භාෂා සංගම් නියෝජිතයන් සහ අම්පාර දිස්ත්‍රික්කයේ ජනමාධ්‍යවේදීන් අතර සම්බන්ධීකරණ ජාලයක් ගොඩනැගීම පසුගිය දා සිදුවිය. මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන බලප්‍රදේශය තුළ ජීවත් වන සුළුතර ජාතිකත්ව ප්‍රජාවට භාෂාව නිසා අත්විඳීමට සිදුවන අසාධාරණයන් ජනමාධ්‍ය මගින් හෙළිදරව් කිරීම මූලික අරමුණ විය.

අම්පාර දිස්ත්‍රික්කයේ පැවති මෙම වැඩමුළුවේ දී භාෂාව පිළිබඳව ශ්‍රී ලංකාව තුළ පවතින නීතිමය පසුබිම හා භාෂා නීති උල්ලංඝනය වන අවස්ථාවන්හි දී ඒ සඳහා ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳව නීතිඥ එස්. ජී. පුංචිහේවා මහතා කරුණු පැහැදිලි කළේ ය. ප්‍රදේශවාසීන්ගේ අත්දැකීම් ද ආශ්‍රිතව මේ පිළිබඳ සාකච්ඡාව ගොඩනැගිනි.

භාෂා අයිතීන් උල්ලංඝනය කිරීම පිළිබඳ සිද්ධීන් ජනමාධ්‍ය මගින් වාර්තා කරන ආකාරය පිළිබඳව මාධ්‍යවේදී තිඹිරියාගම බණ්ඩාර මහතා කරුණු පැහැදිලි කළේ ය. වාර්තා කිරීම පිළිබඳව හැරුණු විට මෙම උල්ලංඝනයට අදාළ තොරතුරු රැස්කිරීම ගොනු කිරීම හා ජනමාධ්‍ය මගින් එම ප්‍රවෘත්ති වාර්තා කිරීම පිළිබඳ මෙහිදී සාකච්ඡා විය.

**මෙහිදී විවිධ ප්‍රජා සංවිධාන නියෝජිතයන් ප්‍රදේශයේ ජනමාධ්‍යවේදීන් වෙත ඉදිරිපත් කළ භාෂා අයිතීන් පිළිබඳ ගැටලු කිහිපයක් මෙසේ ය.**

# භාෂා ගැටලු මාධ්‍ය ඇසින්



තම ප්‍රදේශයේ පිහිටා ඇති රාජ්‍ය ආයතනයන් විසින් නිකුත් කරනු ලබන ලේඛන සිංහල භාෂාවෙන් පමණක් නිකුත් කිරීම නිසා දෙමළ ප්‍රජාව මහත් අපහසුතාවයකට පත්වන බව අම්පාර, සෙන්ට්‍රල් කෑම්ප් භාෂා සංගමය පවසයි.

දෙමළ භාෂාවෙන් පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට ගිය කාන්තාවකගේ පැමිණිල්ල දෙමළ භාෂාව නොදත් පොලිස් නිලධාරියකු විසින් සිංහල භාෂාවෙන් සටහන් කොට, පැමිණිල්ල ඉදිරිපත් කළ කාන්තාවගේ අත්සන බලෙන් ලබාගත් බව අම්පාර දමන ප්‍රදේශයෙන් වාර්තාවේ. ඇය මේ පිළිබඳව රාජ්‍ය භාෂා කොමිසමට පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති බවට ද වාර්තා වේ.

කල්මුණේ පොලිසියේ සේවයේ නියුතු පොලිස් නිලධාරීන් දෙමළ භාෂාව නොදන්නා නිසා, පැමිණිලි ඉදිරිපත් කිරීමට යන දෙමළ ජනතාව අපහසුතාවයට පත්වන බව කල්මුණේ භාෂා ප්‍රවර්ධන සමිතිය පැවසී ය. පොලිස් නිලධාරියා තමන් දෙමළ භාෂාව දන්නා බව හඟවමින් පැමිණිල්ල සටහන් කර ගන්නා අතර පැමිණිල්ල ඉදිරිපත් කිරීමට යන පුද්ගලයා පොලීසියට ඇති බිය නිසා ඒ පිළිබඳ ප්‍රශ්න කිරීමට ඉදිරිපත් නොවන බව ඔවුහු පැවසූහ. විශේෂයෙන් ම හදිසි අනතුරු පිළිබඳ සිද්ධීන් පිළිබඳ පැමිණිලි කරන්නට යන විට වඩාත් අපහසුතාවයන්ට පත්වන බවද ඔවුහු හිඟුරන ප්‍රදේශයේ ආර්ථික මධ්‍යස්ථානයට ගිය ද්‍රවිඩ කාන්තාවකට සිංහල භාෂාව කතා කිරීමට නොදත් නිසා තමන්ගේ රාජකාරිය ඉටුකර ගැනීමට බොහෝ වේලාවක් එම කාර්යයාලයේ රැඳී සිටීමට සිදුවූ බව වාර්තා වේ. එම ආයතනයේ එක් නිලධාරියකු හැර සෙසු සියලුම නිලධාරීන් සිංහල බවත් ඔහු ඒ මොහොතේ කාර්යාලයේ නොවූ බවත් එම දෙමළ නිලධාරියා පැමිණෙන තුරු ඇයට බොහෝ වේලාවක් එම කාර්යාලයේ රැඳී සිටීමට සිදුවූ බවත් ඇය පැවසුවා ය.

සිංහල පාසල් වල දෙමළ භාෂාව ඉගැන්වීම සඳහා ගුරුවරු නොමැතිවීම නිසා සිංහල භාෂාවෙන් අධ්‍යාපනය හදාරන සිසුන් දැඩි අපහසුතාවයකට පත්වන බව අම්පාර දිස්ත්‍රික්කයෙන් වාර්තාවේ. පාසල් දරුවන්ට දෙමළ භාෂාව ඉගැන්වීමට කටයුතු කිරීම ස්ථිර සාමයකට ළඟා වීමට පිටුවහලක් බවද ප්‍රදේශවාසීහු පැවසූහ.

අම්පාර දිස්ත්‍රික්කයේ, දමන රජයේ රෝහලේ සිංහල භාෂාව පමණක් කතා කිරීමට දත් වෛද්‍යවරුන් සේවයේ නියුතු වීම නිසා ප්‍රතිකාර ගැනීම සඳහා රෝහලට යන දෙමළ ජනතාව අපහසුතාවයන්ට පත්වන බව ප්‍රදේශවාසිහු පැවසූහ.

අම්පාර දිස්ත්‍රික්කයේ දෙමළ පාසල් වල සිංහල භාෂාව ඉගැන්වීම සඳහා ගුරුවරු නොමැති වීම හේතුකොට ගෙන සිසුන් දැඩි අපහසුතාවයකට පත්වන බව ප්‍රදේශවාසීහු පවසති. විශේෂයෙන්ම පහ වසර ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින සිසුන්ට විභාග ප්‍රශ්න පත්තරයේ එක් කොටසකට සිංහල භාෂාවෙන් පිළිතුරු ලිවීමට ඇති බැවින් සිසුන්ට දැඩි අසාධාරණයක් සිදුවන බව ප්‍රදේශවාසීහු පෙන්වා දෙති.

අම්පාර දිස්ත්‍රික්කයේ පාරවල් සඳහා යොදා ඇති නාම පුවරු ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සඳහන් කිරීම නිසා එම ප්‍රදේශයේ ජීවත් වන දෙමළ සහ සිංහල ජනතාව අපහසුතාවයන්ට පත්වන බව ද ප්‍රදේශවාසීන් පවසති.

දමන ප්‍රදේශයේ සිට ත්‍රිකුණාමලය නගරයට තමන්ගෙ භාණ්ඩ වෙළඳන් කිරීමට පැමිණෙන වෙළෙඳුන්ට දෙමළ භාෂා නොදන්නා බැවින් තම භාණ්ඩ අලෙවි කරගැනීමට අපහසු වී ඇති බව ප්‍රදේශවාසීන් පවසති.

අම්පාර නගරයේ සිට ගමන් ආරම්භ කරන රජයේ සහ පුද්ගලික සේවා බස්රථ වල ගමනාන්තය දැක්වෙන නාමපුවරු සිංහල භාෂාවෙන් පමණක් මුද්‍රණය කර තිබීමෙන් සිංහල කියවීමට නොදන්නා මගීන් බරපතල අපහසුතාවයකට පත්වන බව හිඟුරාන භාෂා සංගමයේ සාමාජික කළුපහන මහතා පවසයි. දෙමළ බස කතා කරන ප්‍රදේශ වල භාෂා දෙකෙන්ම නාමපුවරු ප්‍රදර්ශනය කර තිබුණත් කෙත්සිරිගම, පන්සල් ගම වැනි ප්‍රදේශයකට යාමට පැමිණෙන සිංහල නොදන්නා මගීන් දැඩි අපහසුතාවයන්ට ලක්වන බව කළුපහන මහතා වැඩිදුරටත් පැවසුවේ ය.

රාජකාරී අවශ්‍යතාවයකට අම්පාර කච්චේරියට යාමට සිදුවීම තමා තම ජීවිතයේ මුහුණ දුන් බරපතලම ගැටලුව බව තම්බලුවිල පදිංචිකාරියක වන ශිව නන්දනී මහත්මිය පැවසුවා ය. නගරයේ බස් නැවතුමෙන් බැස කච්චේරිය සොයා යාමේ සිට තම රාජකාරී අවශ්‍යතාවය

11 පිටුවට



"සියල්ල සැලකිල්ලට ගෙන බලන විට භාෂාව අනන්‍යතාවයේ අවියෝජනීය අංගයක් බව පැහැදිලියි. එය අනන්‍යතාවයේ කොටසක්. එය සංස්කෘතිය හා අනාගතය පෝෂණය වීම සඳහා වූ ප්‍රවේශයක්. ජනතාව අතර සමානත්වය, අභිමානය හා ගෞරවය දක්වන ප්‍රධාන දර්ශකයක් වන්නේත් භාෂා අයිතීන් පිළිගැනීමයි."



*ආචාර්ය*
***පාක්‍යසෝති සරවනමුත්තු***

**තමන්ගේ භාෂා අයිතීන් හි වැදගත්කම අවධාරණය කරන අතරම අනෙක් ජාතීන්ගේ භාෂා අයිතීන් පිළිගැනීමත් වැදගත් වෙනවා.**

# භාෂා අයිතිය අහිමි කිරීම මිනිස්කමට අපහාසයක්

**ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු මහතා උතුරු හා නැගෙනහිර ගම් ප්‍රදේශ කිහිපයක භාෂා සංගම් නියෝජිතයන් හා ප්‍රාදේශීය ජනමාධ්‍යවේදීන් ඒකාබද්ධව පැවැත්වූ රැස්වීම් මාලාවක් අමතමින් ඉදිරිපත් කළ අදහස් කිහිපයක් ඇසුරෙන් මෙම ලිපිය සකස් කර ඇත.**

"ඔබ දන්නා පරිදි අද ලංකාව පවතින්නේ පශ්චාත් යුද තත්ත්වයක. එය පශ්චාත් ගැටුම් තත්ත්වයක් නොවෙයි. එයින් අදහස් වන්නේ යුද්ධය වෙත රට මෙහෙය වූ හේතූන් හට පිළියම් යෙදීම තවමත් සිදු වී නැති බවයි. මෙය සැබැවින්ම සබැඳෙන්නේ ශ්‍රී ලංකාවේ රජයට සහ එහි ජීවත්වන සියලු ජනතාවන් හට සමාන ගෞරවයකින් හා සමාන අභිමානයකින් එක්ව ජීවත්විය හැකිවීම සමඟයි. නමුත් එය සිදුවිය යුත්තේ අවසන් වශයෙන් ගත්කල අප බහුජාතික සමාජයක්ය යන්න පිළිගනිමිනුයි."

ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු මහතා මෙම අදහස් පළ කළේ උතුරු හා නැගෙනහිර ගම් ප්‍රදේශ කිහිපයක භාෂා සංගම් නියෝජිතයන් හා ප්‍රාදේශීය ජනමාධ්‍යවේදීන්ගේ ඒකාබද්ධ රැස්වීම් මාලාවක් අමතමිනි.

වැඩිදුරටත් අදහස් දක්වමින් ඉහත කී තත්ත්වයට ළඟා වීම සඳහා සහතික කරගත යුතු වූ කරුණු ගණනාවක් ඇති බවද සරවනමුත්තු මහතා පැහැදිලි කළේ ය.

හමුදාකරණය ප්‍රධාන ප්‍රශ්නයක් බවත් අපගේ ආර්ථිකයට හමුදාව සම්බන්ධ වීම, මෙයින් අදහස් වන බවත් ඔහු පැවසී ය. ඉඩම් පිළිබඳ ප්‍රශ්න හා රට තුළ අවතැන් වූ ජනතාව පිළිබඳ ගැටලු ද මේ අතර තිබේ. මූලික නීතියේ ආධිපත්‍ය පිළිබඳවූ ගැටලු කෙරෙහි ද අවධානය යොමු කිරීමට සිදුවී තිබේ. උදාහරණයක් ලෙස අද අගවිනිසුරුවරියට එරෙහිව පාර්ලිමේන්තුවට දෝෂාභියෝග යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබීමට ඉඩ තිබෙනවා. ඒ වගේම අතීතයේ සිදුවූ මානව හිමිකම් උල්ලංඝනයන් පිළිබඳව වූ ප්‍රශ්න තිබෙනවා. ඒවා පිළිබඳව කිසිවක් සිදුවී නැහැ. එවැනි සිදුවීම් වර්තමානයෙත් සිදුවෙනවා. නමුත් ඒ පිළිබඳව කිසිවක් සිදුවන්නේත් නැහැ. රජයට සහ එල්.ටී.ටී.ඊ යට එරෙහිව යුද අපරාධ චෝදනා එල්ලවී තිබෙනවා. නමුත් ඒ පිළිබඳව කිසිවක් සිදුවී නැහැ. මෙයින් මතු කරන ප්‍රශ්නය වන්නේ අප රටට අද අවශ්‍ය වන්නේ කුමක් ද යන්නයි. මම යෝජනා කරන්න කැමතියි අද ශ්‍රී ලංකාවට අවශ්‍ය වන්නේ ජාතික සමගිය බව. මේ රටේ සියලු ජනතාවන් අතර සමගි සංධානයකින් තොරව ජාතික සමගියක් ලබාගත හැකි දැයි අප අපගෙන්ම අසාගත යුතුයි. සිදුවෙමින් පවතින දේ පිළිබඳව වූ සත්‍යය පිළිබඳව වගවීමකින් හෝ සරලව ගතහොත් පිළිගැනීමකින් තොරව අපට සමගි සන්ධානයක් ලබාගත හැකි දැයි යන්නත් අප අපගෙන් ම අසා ගත යුතුයි.

සිදුවී ඇති දෙයට අනුව පිළිගැනීමක් හෝ වගවීමක් ලබාග ැනීම පමණක් ම නොවෙයි ප්‍රශ්නය හෝ අභියෝගය වන්නේ, එනම් සිදුවෙමින් පවතින දේ හා කරමින් පවතින දේ පිළිබඳ වූ තොරතුරු බෙදා හදා ගැනීමත් ඊට අයත්. එය අතීතය පිළිබඳ වූ ප්‍රශ්නයක් පමණක්ම නොවෙයි. එය වර්තමානය පිළිබඳ වූ ප්‍රශ්නයක් ද වෙනවා. ඒ වගේම ඊටත් වඩා එනම් වඩාත්ම වැදගත් ලෙස එය අනාගතය පිළිබඳව ප්‍රශ්නයක් ද වෙනවා.

මේ රටේ රාජ්‍ය භාෂාවන් දෙක භාවිතා කිරීමට ඇති අමාරුකම් තිබියදී වුවත් මම හැමදාම විශ්වාස කළේ සමගි සන්ධානය සම්බන්ධයෙන් ගත්තත්, ජාතික සංවාදයක් සම්බන්ධයෙන් ගත්තත්, ජාතික සමගිය සම්බන්ධයෙන් ගත්තත්, ශ්‍රී ලංකාවේ භාෂා අයිතීන් පිළිගැනීම හා සාක්ෂාත් කිරීම වැදගත් වන බවයි.

සියල්ල සැලකිල්ලට ගෙන බලන විට භාෂාව අනන්‍යතාවයේ අවියෝජනීය අංගයක් බව පැහැදිලියි. එය අනන්‍යතාවයේ කොටසක්. එය සංස්කෘතිය හා අනාගතය පෝෂණය වීම සඳහා වූ ප්‍රවේශයක්. ජනතාව අතර සමානත්වය, අභිමානය හා ගෞරවය දක්වන ප්‍රධාන දර්ශකයක් වන්නේත් භාෂා අයිතීන් පිළිග ැනීමයි. ඉතාම සරලව හා පැහැදිලි ලෙසම කිවහොත් මේ රටේ මොනම පුරවැසියෙකුට හෝ මේ රටේ රජය සමඟ හෝ රජයේ නිලධාරීන් සමග තමන්ට නොතේරෙන භාෂාවකින් සන්නිවේදනයක් කිරීමට සිදුවීම අසාධාරණයක් සහ සත්තකින්ම අපහාසයක්. ඒ වගේම මේ රටේ යම් පුරවැසියෙකුට මේ රටේ නීතිය සමග කටයුතු කිරීමේ දී පොලිස් ස්ථානයකදී හෝ වේවා උසාවික දී හෝ වේවා, තමන්ට නොතේරෙන භාෂාවකින් කටයුතු කිරීමට සිදුවීම අපහාසයක් හා අසාධාරණයක්. සංස්කෘතිය හා ශිෂ්ටාචාරය අනුව ගත්විට මේ රටේ සියලුම ජනතාවට පොදු දේවල් තිබෙනවා. අප එකට බැඳ තබන බොහෝ දේවල් දකින්න පුළුවන්. විශාල ලෙස සැකයෙන්, වැරදි සන්නිවේදනයෙන් හා නොසතුටින් එකිනෙකාගෙන් වෙන්ව අප ජීවත් වුවහොත් අපට ඉදිරිග මනක් යන්නට බැහැ.

අපට 1990 සිට රාජ්‍ය භාෂා පනතක් තිබෙනවා. නමුත් භාෂා අයිතීන් පිළිබඳ වූ ප්‍රශ්නය සම්බන්ධයෙන් තවමත් පවතින්නේ විශාල අවුලක්. සමගි සන්ධානය හා මනුෂ්‍යත්වය දෙසට තැබිය හැකි වඩාත්ම මූලික පියවර වන්නේ මෙය නිරවුල් කිරීමයි.

එක් එක් ජනවර්ගයන් තම තමන්ගේ භාෂා අයිතීන් හි වැදගත්කම අවධාරණය කරන

15 පිටුවට

කීර්තිමත් හිටපු සිවිල් සේවකයකු වන ආචාර්ය දේවනේසන් නේසයියා මහතා යාපනය, මන්නාරම හා මඩකලපුව දිස්ත්‍රික්කයෙහි දිසාපතිවරයෙකු ලෙස සේවය කොට අත්දැකීම් රැසක් ලබා ඇති ලංකා පරිපාලන සේවයේ හිටපු ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකි.

80 දශකය මුල් භාගයේ යාපනය දිසාපතිවරයා ලෙස කටයුතු කළ හෙතම පසුව පාරිසරික අමාත්‍යංශයේ ස්ථිර ලේකම්වරයා ලෙස කටයුතු කොට විශ්‍රාම ලැබුවේ ය.

මේ වන විට ප්‍රකට විද්වතකු ලෙසද සිවිල් සමාජ නිලධාරියකුද ලෙස ද සමාජ මෙහෙවරක නිරතව සිටී.


මෙම ලිපි පෙළ මගින් ඔහු දෙමළ භාෂා අයිතිය තහවුරු කරන කෙටි කාලීන හා දිගු කාලීන පියවර කිහිපයක් කෙරෙහි අවධානය යොමු කරයි.

මෙවර ලිපියෙන් වැඩි අවධානය යොමුවන්නේ කෙටිකාලීන පියවර කෙරෙහි ය.

**ශ්‍රී ලංකාවේ දෙමළ භාෂා අයිතිවාසිකම් පිළිබඳ ලිපි පෙළක iii කොටස**



# භාෂා පිළිවෙත ජයගැනීමට
# ඵලදායී උපායමාර්ග



ආචාර්ය
**දේවනේසන් නේසයියා**

රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට රාජ්‍ය සේවකයින්ගේ කැපවීම අතවශ්‍ය සාධකයකි.

(අ) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කරවීමට හැකිවන පරිදි දෙමළ කතා කරන නිලධාරීන් අලුතෙන් බඳවා ගැනීමට අවශ්‍යවන දෙපාර්තුමේන්තු හා සේවා ශ්‍රේණි හඳුනාගත යුතු ය. මෙම හඳුනාගැනීම රාජ්‍ය පරිපාලන අමාත්‍යංශය විසින් රාජ්‍ය භාෂා කොමිසමේ උපදෙස් පරිදි කළ යුතු අතර මාස 3 ක් හෝ 4 ක කාල රාමුවක් තුළ මෙය කළ යුතු වේ.

ආ) දෙමළ කතා කරන සේවක සංඛ්‍යාවක් සඳහා අවශ්‍ය සංඛ්‍යාව විශේෂයෙන් බඳවාගැනීමට රාජ්‍ය භාෂා කොමිසම විසින් ආණ්ඩුවේ අනුමැතිය ඉල්ලා සිටිය යුතු ය. පවතින පුරප්පාඩු සඳහා නව පත්වීම් සැකසිය යුතු අතර, ප්‍රමාණවත් තරම් පුරප්පාඩු නොමැති නම් අමතර සේවක සංඛ්‍යාව නිර්මාණය කළ යුතු ය. මෙය කළ යුත්තේ ස්වභාවික ඉවත් වීම මගින් අතිරික්ත අය අවසන් වන තුරු අනෙකුත් බඳවා ගැනීමේ අත්හිටුවීමේ අවබෝධය මත ය.

ඇ) ඉන් අනතුරුව රාජ්‍ය පරිපාලන අමාත්‍යංශයේ ලේකම් විසින් සුදුසු අපේක්ෂකයින්ගෙන් ඉල්ලුම්පත් කැඳවිය යුතු ය. පත්වීම් සඳහා දෙමළ භාෂාව කතා කිරීම, කියවීම සහ ලිවීමේ හැකියාව සම්බන්ධවත් පත්වීම් ලබන අවස්ථාව වන විට නිපුණතාවයක් තිබිය යුතු ය. මෙම පත්වීම් වලදී දෙවන හා තුන්වන භාෂාවන් පිළිබඳව නිපුණතාවයක් ඇති අයට ප්‍රමුඛත්වයක් දිය යුතු ය.

ඈ) රාජ්‍ය පරිපාලන අමාත්‍යංශය එක් එක් දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයන්ට අනුව නිලධාරීන් අනුයුක්ත කළ යුතු ය. පත්වීම් දීමට ප්‍රථම රාජ්‍ය භාෂා හැකියාව සැලකිල්ලට ගත යුතු ය. 1999 වසර තුළදී මෙම ක්‍රියාවලිය අවසන් කිරීමට හැකි විය යුතු අතර අවශ්‍ය පත්වීම් ලබා දිය යුතු ය.

ඉ) සිංහල දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පුහුණු වැඩසටහන්වලට දීපව්‍යාප්තව මුල පිරිය යුතු අතර සියලුම වර්ගවල නිලධාරීන්ට අඩුතරමින් භාෂා දෙකක් පිළිබඳ නිපුණතාවයක් හෝ, හැකියාවක් ඇත්නම් භාෂා තුනම පිළිබඳව නිපුණත්වයක් ලබා ගැනීමට ඒ මගින් හැකිවිය යුතු ය.

ඊ) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූල හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අදාළ වගන්ති පිළිබඳ දැනුවත් කිරීම සඳහා ඒකාබද්ධ තෝරාගත් පුහුණු පාඨමාලාවන් ආරම්භ කළ යුතු ය.

උ) සෑම පුද්ගලයකුටම රටේ ඕනෑම පළාතකදී සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි යන භාෂා තුනෙන් ඕනෑම භාෂාවකින් රාජකාරි කටයුතු කිරීමට ඇති අයිතිය පිළිබඳව මහජන දැනුවත් භාවයක් ගොඩනැගිය යුතු ය. එසේම සියලුම රජයේ කාර්යාල සහ ඒවායේ සේවය කරන නිලධාරීන්, අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද ඕනෑම වාර්තාවක්, ලියාපදිංචි සහතිකයක්, ප්‍රකාශනයක් හෝ වෙනත් ලියවිල්ලක් අයදුම් කරන ලද භාෂාවෙන්ම ලබාදීමට හා ඊට අදාළ පිළිතුරු සැපයීමේ සේවාවක් ඔවුන්ට ලබා දීමට බැඳී සිටිය යුතු ය.

ඌ) භාෂා තුනෙන්ම නිපුනතාවයක් ලබා ගන්නා නිලධාරීන්ට නව දිරි දීමනා වැඩපිළිවෙලක් හඳුන්වා දෙමින් අදාළ විභාගයකින් සමත් වූ අයට නිශ්චිත මුදලක් ගෙවිය යුතු ය. එදිනෙදා කාර්යයන්හිදී අතිරේක භාෂාවකින් කටයුතු කළ හැකි යොදාගන්නා පුද්ගලයින්ට මාසික දීමනාවක් ලබාදිය යුත්තේ සාමාන්‍ය කාර්යයන්ට අමතරව වැඩකරන සහ ඔවුන්ගේ මුල් භාෂාව නොවන භාෂාවන්ගෙන් වැඩ කරන අයට ය. මෙම ගෙවීම දැඩි ලෙස පරීක්ෂා කිරීමෙන් අනතුරුව ගෙවිය යුතු යුතු ය. යෝග්‍ය සම්මතයන් පිහිටුවිය යුතු ය. ඒ සඳහා මාසික දීමනාව ලබන්නේ අවශ්‍ය වුවහොත් පිට පළාත්වල සේවය කිරීමට සූදානම් විය යුතු ය.

එ) කාර්ය මණ්ඩලයට මෙම සැපයීම්වලින් පසු වරින් වර අධීක්ෂණයන් කළ යුතු අතර ඒ සම්බන්ධව ලැබෙන පැමිණිලි පිළිබඳව උචිත සලකා බැලීම් කළ යුතු ය. රාජ්‍ය භාෂා කොමිසම විසින් ඕනෑම අමාත්‍යංශයක හෝ දෙපාර්තමේන්තුවක අඩුපාඩුවක් හෝ අලස ආකල්පයක් ඇතිවන්නේ නම්, ජනාධිපතිගේ අවධානය ඒ කෙරෙහි යොමු කිරීමටත් ජනාධිපතිවරයා විසින් සුදුසුයැයි සලකන ඕනෑම පියවරක් ඒ සම්බන්ධව ගත යුතු ය.

ඒ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 22(1) වගන්තියට හඳුන්වාදී ඇති 16 වන ව්‍යවස්ථා සංශෝධනය පරිදි අවශ්‍ය විධිවිධානයන් ජනාධිපතිවරයාට කළ හැකි ය.

සමස්ත ශ්‍රී ලංකාවේම පරිපාලන භාෂාව වන්නේ සිංහල දෙමළ භාෂාවෙන් වේ. දෙමළ භාෂාව භාවිතා කරන උතුරු නැගෙනහිර පළාත්වල හැර ශ්‍රී ලංකාවේ අනෙකුත් සියලුම පළාත්වල රාජ්‍ය ආයතනවල සහ කාර්යාල වල ලේඛන ගත කිරීම් සහ ඒවා නඩත්තු කිරීම සහ ගනුදෙනු කිරීම් සඳහා සිංහල භාෂාව යොදාගනු ලැබේ.

"යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක සිංහල හෝ දෙමළ සුළුතර ජන සංඛ්‍යාවක් වාසය කරන්නේ නම් ඔවුන්ගේ ප්‍රතිශතය සහ උවමනාව පදනම් කරගෙනත්, එම ප්‍රදේශයේ සමස්ත ජන ගහනය ගැන සැලකිල්ලක් දක්වමිනුත් සිංහල හෝ දෙමළ භාෂා ඒ ප්‍රදේශයේ පරිපාලන භාෂාව ලෙස යොදා ගැනේ. එක් භාෂාවකට අමතරව තවත් භාෂාවක් එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පරිපාලන භාෂාව ලෙස යොදාගන්නා මෙන් ජනාධිපතිවරයා කොන්දේසි සහිතව ප්‍රකාශයට පත් කළ හැකි ය."

සමස්ත ශ්‍රී ලංකාවේම පරිපාලන භාෂාවන් ලෙස භාවිතා වේ. එහෙත් ඊට පටහැනි ප්‍රකාශයක් ජනාධිපතිවරයා විසින් ප්‍රකාශයට පත් නොකළහොත් නිශ්චිත පළාතේ රාජ්‍ය ලේඛනගත කිරීම් දෙවැනි භාෂාවකින් හෝ තෙවැනි භාෂාවකින් හෝ කලින්ම ප්‍රකාශයට පත් කළ යුතු යැයි ඉහත ඡේදයෙන් විස්තර කෙරේ. මේ නිසා ආණ්ඩුවේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට ඵලදායි උපාය මාර්ගයෙන් සැලසුම් කළ හැකි ය.

# අලුත් අවුරුද්දේ වෙනස්කම් රැසක් සිදුවෙනවා

රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ සභාපති **නීතිඥ නිමල් ආර්. රණවක මහතා** සමඟ කළ සංවාදයක්.

> **“මේ වන විට ලාංකීය සමාජයේ සෑම පුරවැසියෙකුටම පාහේ ද්වීභාෂා අධ්‍යනය භාෂා පිපාසය දැනෙමින් තියෙනවා. සමාජ සංහිඳියාව හා සංස්කෘතික ගොඩනැගීමට මෙම භාෂා පිළිවෙත ඉවහල් වෙනවා. විශේෂයෙන් ම ද්වි භාෂාවෙන් එකට බැඳුණු එක් ලාංකීය ජාතියක් ගොඩනැගීමෙහිලා මෙම ද්විභාෂා ප්‍රතිපත්තිය ඉතා වැදගත්.”**



*නීතිඥ*
***නිමල් ආර්. රණවක මහතා***

**2012 වසර ත්‍රෛභාෂා වසර ලෙස නම් කෙරුණා. වසර අවසානයේ ආපසු හැරී බලන විට එම ත්‍රෛභාෂා වසර ලෙස නම් කිරීමෙන් ලැබුණු ප්‍රතිඵල ගැන ඔබේ තක්සේරුව කුමක් ද?**

රාජ්‍ය භාෂා කොමිසමේ හැටියට ගත්තොත් අපේ නීත්‍යානුකූල වපසරිය තියෙන්නෙ ද්විභාෂා ප්‍රතිපත්තිය මතයි. මූලිකවම මේ රටේ රාජ්‍ය ආයතන තුළ ද්විභාෂා භාවිතය පිළිබඳව අධීක්ෂණය කිරීම සහ ඒ සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම තමයි අපේ රාජ්‍ය භාෂා කොමිසම කළ යුතුව තියෙන්නේ. ත්‍රෛභාෂාව අනුව ගතහොත් එතනදී ඉංග්‍රීසි භාෂාව ද්වි ප්‍රතිපත්ති යෙන් වෙනස් මගක් ගන්න එකක්. මෙයින් බලාපොරොත්තු වෙන්නේ භාෂා භාවිතයට එහා ගිය වෙනත් අරුතක් සෙවීම. විශේෂයෙන්ම මේ රටේ කාලයක් තිස්සේ එකට ජීවත් වන සමාජ කොට්ඨාශ දෙකක් තියෙනවා. සිංහල කතා කරන සහ දෙමළ කතා කරන සමාජ කොට්ඨාශ වශයෙන්. මේ කොට්ඨාශ දෙක අතරෙ සංස්කෘතික බැඳීමක් ඇති කරන අතර ඕනෑම භාෂාවක් කතා කරන, මේ රටේ ඕනෑම පුරවැසියකුට රට තුළ තම අවශ්‍යතා බාධාවකින් තොරව ඉටු කර ගැනීමට ඉඩ සැලසීම තමයි අපේ අරමුණ වන්නේ. මෙතැනදී (ද්විභාෂාව තුළ) භාෂාවට එහා ගිය වෙනත් බලාපොරොත්තු තියනවා. සමාජ සංහිඳියාව, සංස්කෘතික සබඳතාවයෙන්, විශේෂයෙන්ම ද්වි භාෂාවෙන් ම එකට බැඳුනු එක් ලාංකීය ජාතියක් ගොඩ නැගීම යන අර්ථයකින් තමයි ද්වි භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කෙරෙන්නෙ. ඒ අරමුණු ඇතිව තමයි 2012 වර්ෂය අපේ සියලුම ක්‍රියාකාරකම් සහ ප්‍රතිපත්තිමය තීන්දු අරගෙන තියෙන්නෙ.

**ත්‍රෛභාෂා වසරෙන් මේ වන විට අත්වී තිබෙන ප්‍රතිපල මොනවා ද?**

අපි දියත් කළ වැඩසටහන් මගින්, මූලිකවම භාෂා විගණනයක් සහ භාෂා සමීක්ෂණ සිදුවුණා. භාෂා විගණන සහ සමීක්ෂණ හරහා අපේ භාෂා ප්‍රතිපත්තිය රාජ්‍ය ආයතන තුළ ක්‍රියාත්මක කිරීම පිළිබඳව තිබෙන මූලික ගැටලු හඳුනා ගැනීමක් කර තිබෙනවා. ඒ හඳුනාගත් ගැටලු වල ස්වභාවය තේරුම් ගෙන ඒ අනුව ක්‍රම ක්‍රමයෙන් භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන් අපි අරඹා තිබෙනවා. අපි මේ වර්ෂය අවසාන වෙන කොට 140 කට ආසන්න රාජ්‍ය ආයතන ප්‍රමාණයක් භාෂා විගණනයට ලක්කර තියෙනවා. ප්‍රදේශයේ ලේකම් කාර්යාල, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, රෝහල් උසාවි ඇතුළුව. රාජ්‍ය ආයතන සමීක්ෂණයට සහ විගණනයට ලක්කර තියෙනවා. ඒ ආශ්‍රයෙන් ලබාගත් කරුණු පදනම්ව අපි පසුගිය වසරේ වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කළා.

විශේෂයෙන්ම රාජ්‍ය භාෂාව ක්‍රියාත්මක කිරීමේ දී රාජ්‍ය ආයතන තුළ වැදගත්ම කාර්ය භාරයක් පැවරෙන්නේ ආයතන ප්‍රධානියාට. ඔහු සතු වගකීම දැනුවත් කිරීම වැදගත්. මෙහිදී භාෂා අයිතිය, පුරවැසි අයිතියක් වගේම නිලධාරීන්ගේද වගකීමක් වෙනවා. මේ තත්ත්වය පුරවැසියන් මෙන්ම නිලධාරීන්ද තේරුම් ගත යුතුයි. එසේ නොමැති වුවහොත් හැම වෙලාවකම නිලධාරීන්ගේ අවශ්‍යතා වෙනුවෙන් පුරවැසියන් යටපත් වන අවස්ථාවන් තිබෙනවා.

නමුත් පුරවැසියන් තම අයිතිය ඉල්ලා සිටීම ඉතා වැදගත්. ඒ අනුව විශේෂයෙන් අපි වසර තුළ නිලධාරීන් සහ පුරවැසියන් දැනුවත් කිරීම සඳහා වූ මුද්‍රිත, ගුවන් විදුලි, රූපවාහිනී මාධ්‍ය හරහා දැනුවත් කිරීමේ වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කළා. අපිට එහි සාධනීය ප්‍රතිඵල ලැබිල තිබෙනවා. විශේෂයෙන්ම රාජ්‍ය භාෂා කොමිෂම මගින් කරන ලද දැනුවත් කිරීම් හරහා දැනුවත් වුණු පුරවැසියන්ගෙන් නොකඩවා පැමිණිලි ලැබෙන්නට පටන් ගත්තා. මේ අනුව සමාජය තුළ වී තිබෙන දැනුවත්කම භාෂා භාවිතයේ දී ඉතා වැදගත්. ඉදිරි වසර තුළ මේ ගෙවී යන 2013 වසරට වඩා සම්පත් යොදවමින් මේ දැනුවත් කිරීම ශක්තිමත් කිරීමට බලාපොරොත්තු වෙනවා.

**රජයෙන් මේ සඳහා ලැබෙන අනුග්‍රහය කෙබඳුද?**

මේ වසර ආරම්භයේ දීම එනම් ජනවාරි මාසය තුළම ත්‍රෛභාෂා වසර හඳුන්වා දීම සඳහා විශේෂ රාජ්‍ය උත්සවයක් පැවැත්වුණා. මෙබඳු වැඩසටහනක් වෙනුවෙන් මෙතරම් ප්‍රබලව මේ රටේ රාජ්‍ය අනුග්‍රහය ලබා දුන්නේ ප්‍රථම වතාවටයි. මෙතැනදී ද්වි භාෂාව හැරුණු විට ඉංග්‍රීසි භාෂාව ද ඇතුළත්ව ලංකා සමාජය තුළ ඉදිරි දශකයක් තුළ පරිපූර්ණ භාෂා දැනුම ඇති සමාජයක් බවට පත් කිරීමට අපේක්ෂා කරනවා. මෙහි දී රාජ්‍ය අනුග්‍රහය නිල වශයෙන් වසර ආරම්භයේදී ම ලැබුණා. ඒ අනුග්‍රහය අපිට විශාල පිටුවහලක් වුණා. රාජකාරි කටයුතු කරගෙන යාමේ දී ත්‍රෛභාෂා ප්‍රතිපත්තිය තහවුරු කිරීමට රජය ඉදිරියට පැමිණීමෙන් විශාල සමාජ කතිකාවතක් ඇතිවුණා. ඒ තුළින් අපේ මැදිහත් වීම් සඳහා විශාල ශක්තියක් ලැබුණා.

> අපි මේ වර්ෂය අවසාන වෙන කොට 140 කට ආසන්න රාජ්‍ය ආයතන ප්‍රමාණයක් භාෂා විගණනයට ලක්කර තියෙනවා.

**ද්විභාෂාව හෝ ත්‍රෛභාෂාව අධ්‍යයනයට වැඩිපුර නැඹුරුවීමක් ඇති පිරිස් ඔබ හඳුනාගෙන තියෙනවාද?**

ඔව් ඇත්තටම, සාමාන්‍යයෙන් රාජ්‍ය භාෂා හා සමාජ ඒකබද්ධතා අමාත්‍යංශය විසින් කරන ලද ව්‍යාපෘති වලදී ඔවුන් භාෂා සංගම් 1000 කට භාෂා උපදේශකයන් සපයමින් භාෂා දැනුම ලබා දී තිබෙනවා. 2012 වසරේ දී 16000 කට ආසන්න පිරිසකට අමාත්‍යංශය යටතේ තියන ජාතික භාෂා හා පුහුණු අධ්‍යතන ආයතනය මගින් භාෂා නියෝජිතයන් ලබා දී තිබෙනවා.

මේ කරුණු සලකා බැලීමේ දී මේ භාෂා පිපාසය අපේ සමාජයේ හැම පුරවැසියකුටම දැනී තිබෙන බව මට හැඟෙනවා. දශක තුනක යුද්ධයේ අවාසනාවන්ත ප්‍රතිඵල ඊට බලපෑ එක හේතුවක් විය හැකියි. දශක ගණනාවක් පැවති යුද්ධය සහ යුද්ධයේ අහිතකර ප්‍රතිඵල දෙස විමර්ශනාත්මකව බලන ජනතාව ඊට දිගු කාලීන පිළියමක් ලෙස භාෂා දැනුම අවශ්‍ය යැයි තේරුම් ගත් බවක් අපට පේන්න තියෙනවා. එසේම රටපුරා ගොඩනැගෙන භාෂා සංගම් පද්ධතියක් රාජ්‍ය භාෂා කොමිසම විසින් ප්‍රයෝජනයට ගනු ලබනවා. විශේෂයෙන් LLRC නිර්දේශ තුළ රාජ්‍ය භාෂා කොමිසමෙහි කාර්යයන් ගම් මට්ටමට ගෙන යා යුතු යැයි උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම පැහැදිලිව නිර්දේශ කර තිබෙනවා. නමුත් තවම මේවා කොළඹට පමණක් සීමා වෙලා තියෙනවා. අපට දැන් තත්ත්වානුකූලව ගම් මට්ටම දක්වා මෙම වැඩසටහන් ගෙන යාමේ ක්‍රමවේදයක් සකස් කිරීමට අවශ්‍යව තිබෙනවා. එහෙත් ඒ සඳහා කාලය අවශ්‍යයයි. අපි ඒ සඳහා භාෂා සංගම් ප්‍රයෝජනයට ගෙන ගම් මට්ටමින් ඇති රාජ්‍ය ආයතනවල රාජ්‍ය සේවාවන්හි භාෂා ප්‍රගතිය පිළිබඳ වාර්තා ලබා ගනිමින් සිටිනවා.

මෙය ඉතා සාර්ථකයි. දෙසැම්බර් 31 වන විට ලංගම සහ පෞද්ගලික මාර්ග ප්‍රවාහන අධිකාරි තුළ ගමනාන්ත පුවරු ත්‍රෛභාෂාවෙන් සමන්විත විය යුතු යැයි නිර්දේශ නිකුත් කර දැන් පසුවිපරම් කරමින් සිටිනවා. මේ පසු විපරම්වලට සම්පූර්ණ දායකත්වය ලබාදෙන්නෙ භාෂා සංගම්වල නිලධාරීනුයි. දැනට අපිට විශාල ප්‍රතිචාරයක් ලැබෙනවා. අපි හිතනවා මේ භාෂා ප්‍රතිපත්තිය පිළිබඳව සමාජයේ ලොකු උනන්දුවක් ඇතිවෙලා තිබෙන බව. අද එය රජයේ සේවකයන්ට පමණක් සීමා වූ දෙයක් නෙමෙයි. ශිෂ්‍යයින්, අධ්‍යාපන හේතු මත භාෂාව ඉගෙන ගන්නවා. රජයේ සේවකයින් උසස් වීම් සඳහා භාෂාව හදාරණවා. නමුත් ඉන් ඔබ්බට ගිය සමාජ අවස්ථා තේරුම්ගත් පිරිසකුත් සිටින බව අපි දැනගත යුතුයි.

**දුම්රිය ස්ථාන, බස් නැවතුම්පොළ වැනි පොදු ස්ථානයන්හි භාෂා**

සංවාද සටහන
**සඳමාලි සෙනෙවිරත්න**

15 පිටුවට




# රාජ්‍ය ආයතනවලදී භාෂා ගැටලු ඇතිවන්නේ ආයතන ප්‍රධානීන්ගේ වරදින්

**අමාත්‍ය වාසුදේව නානායක්කාර**

***ලක්බිම - 2012.11.29***
***මිහිරි ෆොන්සේකා***

## ජාතික භාෂා ඇමතුම් මධ්‍යස්ථානය විවෘත වේ.

රජ්‍ය ආයතනයකයදී තම කාර්ය තමන්ගේ මව් භාෂාවෙන් ඉටුකර ගැනීමට නොහැකි වන පුරවැසියන්ට ඒ පිළිබඳ පැමිණිලි කිරීමට 1956 කෙටි දුරකතන ඇමතුම් සේවයක් පසුගිය දා (28) උදෑසන නිල වශයෙන් ආරම්භ කෙරුණි.

රාජගිරිය බුද්ධ මුව පාරේ ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශ පරිශ්‍රයේ ආරම්භ කළ ජාතික භාෂා ඇමතුම් මධ්‍යස්ථාන විවෘත කළේ ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා ඇමැති වාසුදේව නානායක්කාර මහතා විසිනි.

රජයේ කාර්යාල වේලාවන්හි විවෘතව තිබෙන ජාතික භාෂා ඇමතුම් මධ්‍යස්ථානයේ ත්‍රෛ භාෂාවෙන්ම රාජකාරි කළ හැකි නිලධාරියෝ සිටිති.

දැනට දිවයිනේ බොහෝ ආයතනවල ක්‍රියාත්මක වන භාෂා ඇමතුම් මධ්‍යස්ථානයන්ට වඩා දියුණු කරන ලද උසස් තාක්ෂණික හා සන්නිවේදන ක්‍රමෝපායන් අනුව විදුලි සංදේශ නියාමන කොමිසම් සභාවේ හා රාජ්‍ය තොරතුරු තාක්ෂණ නියෝජිතායතනයේ පූර්ණ මැදිහත් වීම මත මෙම භාෂා ඇමතුම් මධ්‍යස්ථානය ගොඩනගා තිබේ.

භාෂා ගැටලු, භාෂා භාවිතය පිළිබඳ තොරතුරු, භාෂා අධ්‍යාපනික අවස්ථාවන් පිළිබඳ තොරතුරු දීම, භාෂා භාවිතයේ දී පුරවැසියන්ට ඇති වන ගැටලුවලට විසඳුම් දීමට ආයතන ප්‍රධානීන් සම්බන්ධ කිරීම ජාතික භාෂා ඇමතුම් මධ්‍යස්ථානයට පැවැරී තිබේ.

වැඩිදුරටත් අදහස් දැක්වූ වාසුදේව නානායක්කාර ඇමතිවරයා මෙසේ කීය.

රාජ්‍ය ආයතනයක දී තම කාර්ය තම මව් භාෂාවෙන් ඉටුකර ගැනීමට නොහැකි වන පුරවැසියන්, ඒ පිළිබඳ ජාතික භාෂා ඇමතුම් මධ්‍යස්ථානයට කරන පැමිණිලි නොසලකා හරින ආයතන ප්‍රධානීන්ට එරෙහිව විනය පියවර ගන්නවා.

1956 කියන්නේ ඉංග්‍රීසි භාෂාවේ වහල් භාවයෙන් මිදී ස්වභාෂාව රජ කළ වසර හැබැයි එතැනදී සිංහල පමණයි. රාජ්‍ය භාෂාව කළේ. එය වැරැද්දක්. එහෙත් එම වැරැද්ද පසුව නිවැරදි කළා. අපගේ කෙටි සංකේත අංකය 1956 යොදා ගත්තේ විශාල අර්ථයක් ඇතිවයි. ඒ ස්වභාෂාව රජ කළේ එම වසරේදී නිසයි. අප ඉංග්‍රීසි ඉගෙන ගත යුතුයි. එය දැන ගැනීම අමතර සුදුසුකමක්. කුසලතාවක්. අප ඉංග්‍රීසි කතා කළ යුත්තේ සුද්දන් මෙන් නොව අපේ රටට ගැලපෙන පරිදියි. හැබැයි ඉංග්‍රීසියට ස්වභාෂා යටවෙන්න ඉඩ තියන්න එපා. ඉංග්‍රීසිය දැන ගැනීම ප්‍රඥාවන්ත කමේ සලකුණක් නොවේ. හැබැයි සිංහල හා දෙමළ යන ස්වභාෂා නොදැනීම ප්‍රඥාවන්තකමේ අඩුපාඩුවක්.

රටේ භාෂා ප්‍රශ්නයක් උද්ගත වුණේ පුරවැසියන් ස්වභාෂා නොදැනීම නිසයි. රාජ්‍ය ආයතනවලදී භාෂා ගැටලු ඇති වන්නේ රාජ්‍ය ආයතන ප්‍රධානීන්ගේ වරදින්.

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම ගැසට් මගින් ඔවුන්ට පවරා තිබෙනවා. ඇතැම් නිලධාරීන් ලිපිවලට අත්සන් කරන්නේ මේ ලිපිය ලැබෙන පුද්ගලයාට ලිපිය තිබෙන භාෂාව කියවන්න පුළුවන්ද කියලාවත් හිතන්නේ නැතිවයි. මේ නිසා මට සිද්ධ වුණා මහ ඇමති, ඇමති, අමාත්‍යාංශ ලේකම්වරුන්ට ලිපියක් යවලා ඔබ අත්සන් කරන ලිපිය ගැන දෙවරක් හිතන්න එහෙම නැත්නම් ලිපියේ සහතික කළ පරිවර්තනයකුත් යවන්න කියලා.

සමහරු අහනවා දෙමළ ජනතාවට තිබෙන විශේෂ ප්‍රශ්න මොනවාද කියලා. රජයේ ආයතනයකට ගිහින් තමන්ගේ මව් බසින් වැඩකරගන්න බැරි නම් වවුනියාවේ ගමට යන දෙමළ වැසියාට දුම්රිය පෙළේ දී දෙමළ භාෂාවෙන් නිවේදන කටයුතු කරන්නේ නැතිනම් බසයේ තමන්ගේ නමින් නාම පුවරුවක් නැතිනම් ඔවුන් කොතරම් අසරණ වෙනවාද ඒක ඔවුන්ට ලැබෙන වරප්‍රසාදයක් ද? අප නොදන්නා භාෂාවකින් අපට කටයුතු කරන්න කීවොත් අප කොතරම් අපහසුතාවකට ලක් වෙනවාද? මේ ගැන ඔය කියන මහත්වරුන් කල්පනා නොකරන්නේ ඇයි?

ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ලේකම් මල්කාන්ති වික්‍රමසිංහ, රාජ්‍ය භාෂා අධ්‍යයන පුහුණු මධ්‍යස්ථානයේ සභාපතිනී සීතා විතානච්චි යන මහත්මීහුද, රාජ්‍ය භාෂා කොමසාරිස් ජේ. ඩී. ජයසිංහ, රාජ්‍ය කොමිසමේ සභාපති නිමල් රණවක, අමාත්‍යාංශ උපදේශක සංඛජය නානායක්කාර යන මහත්වරු ද මේ අවස්ථාවට සහභාගි වූහ.

# රාජ්‍ය බැංකු ලේඛන සිංහල හා දෙමළ භාෂාවලින්

***ලක්බිම - 2012-11-29***
***මිහිරි ෆොන්සේකා***

රාජ්‍ය බැංකුවල ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සකස්කර තිබෙන ගිවිසුම් ඇතුළු සියලු ලේඛන දෙසැම්බර් තිස් එක්වැනිදාට පෙර සිංහල හා දෙමළ භාෂාවෙන්ද මුද්‍රණය කිරීම අනිවාර්ය බව රාජ්‍ය භාෂා කොමිසමේ සභාපති නිමල් රණවක මහතා පවසයි.

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය අනුව සිංහල හා දෙමළ ස්වභාෂාවලින් රාජ්‍ය ආයතන සමග රාජකාරි කර ගැනීමට සෑම පුරවැසියකුටම ව්‍යවස්ථාවෙන් අයිතිවාසිකමක් ඇතිමුත් රාජ්‍ය ආයතන වල සියයට හැටක් පමණ මේ තත්ත්වය දක්නට නැති බවද ඒ මහතා කී ය.

විශේෂයෙන් බැංකු කටයුතුවලදී ස්වභාෂාවෙන් රාජකාරි කර ගැනීමේදී පුරවැසියන්ට උද්ගත වන ගැටලුවලට පිළියමක් ලෙස බැංකු ලිපි ලේඛන සිංහල හා දෙමළ ද්විභාෂාවලින්ද, මුද්‍රණය කරන ලෙස දැනුම් දී තිබෙන බවද රාජ්‍ය භාෂා කොමිසමේ සභාපතිවරයා කී ය.

ඔහු මේ බව පැවසුවේ රාජගිරිය බුත්ගමුව පිහිටි ජාතික භාෂා හා සමාජ ඒකබද්ධතා අමාත්‍යාංශයේ ඊයේ (28) උදෑසන පැවැති ප්‍රවෘත්ති සාකච්ඡාවකදී ය.

බැංකු ලිපි ලේඛන පමණක් නොව ඔසුසල්වල අලෙවි කරන ඖෂධ සමග නිකුත් කරන උපදෙස් පත්‍රිකා මෙන්ම පෞද්ගලික හා ලංගම බස්වල ගමනාන්තය දැක්වෙන නාමපුවරුද ස්වභාෂාවලින් සඳහන් කිරීම අනිවාර්ය කර ඇති බවද සභාපතිවරයා පැවැසී ය.

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය උල්ලංඝනය කරන බස් රියැදුරන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරන ලෙසට පොලිස්පතිවරයාට දැනුම් දීමටද පියවරගෙන ඇති බව නිමල් රණවක මහතා වැඩිදුරටත් කී ය.

# ඉංග්‍රීසි ගුරුවරුන්ට නාට්‍ය පුහුණුව

***දිනමිණ 2012 නොවැම්බර් 17***
***වතුරුගම සමූහ***
***කේ. කේ. එස්. ආරියදාස***

ගම්පහ අධ්‍යාපන කලාප බල ප්‍රදේශයේ පාසල්වල සේවය කරන ඉංග්‍රීසි මාධ්‍ය ගුරුවරුන් සඳහා ඉංග්‍රීසි නාට්‍යකරණය සහ භාෂා විලාසය පිළිබඳව ප්‍රායෝගික පුහුණුවක් ලබාදීමේ වැඩපිළිවෙලක් අධ්‍යාපන කාර්යයාල මගින් ආරම්භ කර ඇත.

පාසල්වල ඉංග්‍රීසි මාධ්‍ය නාට්‍යකරණය පිළිබඳව දැනට වඩා විදිමත් සංවර්ධන වැඩපිළිවෙලක් පාසල් සිසුන් අතර ඇති කිරීමත් ඒ සඳහා ඉංග්‍රීසි මාධ්‍ය ගුරුවරුන්ට ඒ සඳහා විධිමත් පුහුණුවක් ලබා දීමත් සඳහා මෙම වැඩමුළුව ආරම්භ කළ බව ගම්පහ අධ්‍යාපන කලාපය ඉංග්‍රීසි අධ්‍යාපනය පිළිබඳ සහකාර අධ්‍යක්ෂිකා සංවිධායක චන්ද්‍රානි එස්. ගනේපොළ මහත්මිය පැවසුවා ය.

ප්‍රථම පුහුණු වැඩමුළුව නිට්ටඹුව අධ්‍යාපන පුහුණු හා සම්පත් සංවර්ධන මධ්‍යස්ථානයේදී පැවැති අතර එයට ඉංග්‍රීසි මාධ්‍ය ගුරුවර ගුරුවරියන් විශාල පිරිසක් සහභාගි වූහ.




## පරිවර්තන කෘති 03ක් දොරට වඩී

***වීරකේසරි***
***08-01-2013 (08 වැනි පිටුව)***

ජාත්‍යන්තර දෙමළ ලේඛක සංසදයේ ඔස්ට්‍රේලියානු සංවිධානයක් සූදානම් කළ දොරට වැඩීමේ උත්සවයක් 2013 ජනවාරි 08 වැනි දින ප.ව 5.00ට කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ ශාලා සංකීර්ණයෙදී එෆ් කමිටු ශාලාවේදී පවත්වන ලදී.

මෙම උත්සවයේ මුළසුන හොබවන ලද්දේ ආචාර්ය රාජසිංහම් නරේන්ද්‍රන් මහතා විසිනි. මෙම උත්සවයේ දී ඔස්ට්‍රේලියාවේ වාසය කරන සාහිත්‍යවේදී වෛද්‍ය නොයෙල් නඩේසන්ගේ කෘතියක් සහ එල් මුරුගපූබති මහතාගේ කෘතියක් සිංහලට පරිවර්තනය කොට නිකුත් කරන ලදී.

නඩේසන්ගේ "වන්නාත්ති කුලම්" නමැති දෙමළ නව කතාව "සමනල වැව" යනුවෙන් මඩුලුගිරියේ විජය රත්නයන් විසින් සිංහල භාෂාවට පරිවර්තනය කර තිබුණි. නඩේසන්ගේ තවත් නව කතාවක් වන "උනයේ මයල් කොණ්ඩු" නමැති නව කතාව Lost in you නමින් ආචාර්ය පාර්වදී වාසුදේව විසින් ඉංග්‍රීසියට පරිවර්තනය කරන ලදී.

එල්. මුරුග පූබතිගේ කෙටි කතා එකතුවක් "මද සෙවනැලි" යන නමින් සිංහලෙන් ඒ.සී.එම් කරාමත් මහතා පරිවර්තනය කර තිබේ. සුප්‍රකට සාහිත්‍ය විචාරක කේ.එස්. සිවකුමාරන් මඩුලුගිරියේ විජයරතන, දික්වැල්ලේ කමාල්, හේමසිරි කුරුප්පු, සිඩ්නි මාර්කස් ඩයස්, කරමාත්, යන මහත්වරු විසින් කෙටි දෙසුම් පවත්වන ලදී.

## භාෂා අයිතිවාසිකම් උල්ලංඝනය වන්නේ නම් මානව හිමිකම් කොමිසමට පැමිණිලි කරන්න

### විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය දැනුම් දෙයි

***සුඩර් ඔලි***
***17-01-2013 08 වැනි පිටුව***

උතුරු පළාතේ රෝහල්වල දෙමළ භාෂා අයිතිවාසිකම් උල්ලංඝනය වීම සම්බන්ධයෙන් හානියට පත්වෙන ජනතාවට සෘජුවම මානව අයිතිවාසිකම් කොමිසම වෙත ගොස් පැමිණිලි කළහැකියැයි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය දන්වා සිටී.

උතුරු පළාතේ සමහර රෝහල් වල සිංහල පමණක් දන්නා (දෙමළ බස නොදන්නා) වෛද්‍යවරු, හෙදියන් සහ වෙනත් නිලධාරීන් රාජකාරියේ යොදවා ඇත. එම නිසා දෙමළ පමණක් දන්නා සාමාන්‍ය ජනතාව විශේෂ දුෂ්කරතාවයන්ට මුහුනපා සිටිති. දෙමළ භාෂාව පමණක් දන්නා රෝගීන් රෝහල්වලට යන විට වෛද්‍යවරුන්ට තම රෝගය සිංහල බසින් පැහැදිලි කිරීමට නොහැකිව අසීරු තත්ත්වයකට ඔවුහු පත්ව සිටිති.

සිංහල නිලධාරීන්ට දෙමළ කතා කිරීමට හැකිනම් ප්‍රශ්නයක් නැත. එහෙත්, දෙමළ භාෂාව එම සිංහල නිලධාරීන් දැන නොසිටීම ප්‍රශ්නයක් වේ.

භාෂා අයිතිය මහජනතාවගේ මූලික අයිතිවාසිකමක් වන්නේ ය. එම අයිතිවාසිකම් භුක්ති විඳීමට නොහැකි වීම බරපතල ප්‍රශ්න ඇති වීමටත්, භාෂා අයිතිය උල්ලංඝනය වීමටත් බලපායි.

එම නිසා, භාෂා අයිතිය උල්ලංඝනය වන අවස්ථාවලදී එය සිදුවූ දිනය උල්ලංඝනය වීමේ ස්වභාවය යනාදී තොරතුරු ඇතුළත් කොට සමීපතම මානව හිමිකම් කොමිෂන් සභා කාර්යාලයට ලිඛිතව දැන්විය හැකි බව දැනුම් දෙන ලදී. මීට අමතරව ජාතික භාෂා අමාත්‍යාංශය දැන් ක්ෂණික ඇමතුම් අංකයක් (1956) ලබාදී ඇත. භාෂා අයිතිවාසිකම් උල්ලංඝනය වන විට ද මේ සම්බන්ධයෙන් පැමිණිලි කළහැකිය. තම භාෂා අයිතිය රැක ගැනීමට නම් මේ ආකාරයෙන් ක්‍රියාත්මක විය යුතු බවත් ප්‍රකාශ කරයි.

## භාෂා සංගම් හරහා ද්වි භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක වේ

***තිනක්කුරල්***
*03-01-2013 - 09 වැනි පිටුව*

කල්මුනෙයි දෙමළ අංශයේ පිහිටා තිබෙන ජාතික භාෂා සංගම් හරහා සිංහල භාෂාව ඉගැන්වීම සඳහා පුහුණු පංති පැවැත්වීමට අවශ්‍ය කටයුතු අරඹා ඇත. රටේ ද්වි භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ පදනම ඇතිව දෙමළ ප්‍රදේශවල සිංහල භාෂාවක්, සිංහල ප්‍රදේශවල දෙමළ භාෂාවක් ඉගැන්වීම ජාතික භාෂා අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක වේ.

මීට අනුකූලව ප්‍රාදේශීය ලේකම් කාර්යාල පදනම් කරගෙන භාෂා සංගම් පිහිටුවා ඇත. කල්මුනෙයි දෙමළ ප්‍රාදේශිය ලේකම් කොට්ටාශයේ දැනටමත් භාෂා සංගම් 98කට ආසන්න ප්‍රමාණයක් පිහිටුවා ඇත. 2013 සිට මෙම භාෂා සංගම් හරහා සිංහල භාෂාව ඉගැන්වීමට විධිවිධාන යොදා ඇත.

## පාසල් නොයන දරුවන් 8,091 ක් පාසල් යැවීමට කටයුතු

***දිවයින - 2012.11.30***
***තුෂාරි කළුබෝවිල***

විවිධ හේතු මත පාසල් නොයන දරුවන් 8,091 දෙනකු වහාම පාසල්ගත කිරීමට ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යංශය පියවර ගෙන තිබේ.

ආර්ථික දුෂ්කරතා, දෙමාපියන් අහිමි වීම, පියා හැර යෑම, පාසල්වල පවතින ගැටලු හා ප්‍රවාහන අපහසුතා හේතුවෙන් දිවයිනේ විවිධ ප්‍රදේශවල පාසල් නොයන දරුවන් 8,091 දෙනෙකු සිටින බවට මේ වන විට සමීක්ෂණයකින් හඳුනාගත් බවත්, ඔවුන්ගේ ගැටලුවලට පිළියම් සකස් කර එම දරුවන් පාසල් වෙත යොමු කිරීමට පියවර ගත් බවත් ළමා සංවර්ධන හා කාන්තා කටයුතු ඇමති තිස්ස කරලියැද්ද මහතා "දිවයිනට" පැවසී ය.

සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම සිටින ළමා හිමිකම්, ප්‍රවර්ධන නිලධාරින්ගේ නිරීක්ෂණය ඔස්සේ අදාළ තොරතුරු සොයා බලා එක් දරුවකුට රුපියල් 1,500 ක් බැගින් මුදල් ලබාදීමටත්, උසස් පෙළ හදාරන දරුවන් සිටී නම් එම දරුවන් උදෙසා රුපියල් 2,000 ක මුදලක් ආධාර වශයෙන් ලබාදීමටත් අමාත්‍යංශය පියවර ගත් බව ඇමතිවරයා කීවේ ය.

පාසල් නොයන දරුවන් පාසල් යැවීමේ ව්‍යාපෘතිය පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මගින් සිදුකරන අතර ඒ සඳහා අමාත්‍යංශය මගින් රුපියල් මිලියන 11 ක් දැනට ලබා දී ඇති බවද හෙතෙම පැවසී ය.

තවදුරටත් පාසල් නොයන දරුවන් හඳුනාගැනීම සිදුකරන බවද ඇමතිවරයා කීවේ ය.

# භාෂා පීඩනයේ අමනුස්සකම

> **නැඟෙනහිර පළාතෙහි ජන සංයුතිය බලන විට පෙනී යනුයේ දෙමළ, මුස්ලිම් සහ සිංහල ජනවර්ග තුනම සංඛ්‍යාව අනුව බොහෝ දුරට සමාන බව ය. එහෙත් දෙමළ සහ මුස්ලිම් යන ජනවර්ග දෙකම මව් භාෂාව හැටියට දෙමළ කතා කරන හෙයින් දෙමළ භාෂක සමාජය සුළුතරය බවටත් පත්වේ. එහෙත් රාජ්‍ය හා පුද්ගලික ආයතනවලින් තම සේවාවන් ඉෂ්ට කර ගැනීමට යන මහජනතාවට එල්ල වන භාෂාමය පීඩනය තවමත් තුනී වී නොමැත.**



**"වැරැද්ද වුණේ අපේ අතින් නොවේ. වැරදිකරුවා පැත්තක, ඒත් දඬුවම ලැබුණේ අපට. මේ අසාධාරණය දිගටම වෙනවා"**

ඒරාවූර් ප්‍රදේශයේ ජීවත් වන තරුණයකු වූ සුරේෂ් කුමාර්ගේ ප්‍රකාශයකි ඒ. ඔහු පවසන වැරැද්දත් දඬුවමත් පිළිබඳ සිදුවීම මෙසේ ය.

සුරේෂ් කුමාර් සහ රමේෂ් යතුරු පැදියක යමින් සිටියේ ය. මග අයිනේ සිටි පොලිස් නිලධාරියෙක් යතුරුපැදිය නැවැත්වී ය. ඔහු එසේ කළේ 'සාමාන්‍ය පරීක්ෂාවක්' සඳහා ය. ප්‍රශ්න කළේ තමන් දන්නා සිංහලෙනි. පිළිතුරු ලැබුනේ ඔවුන් දන්නා දෙමළෙනි. පොලිස් නිලධාරියා කෝපයට පත් විය. රිමාන්ඩ් බන්ධනාගාරගත වීමට සුරේෂ්ටත්, රමේෂ්ටත් සිදු විය. එපමණක් නොව පොලිස් අණට පිටු පෑමේ වරදට රුපියල් දස දහසක දඩයකට ඔවුන් යටත් කරන ලදි.

ඔවුන්ගේ ප්‍රකාශ දෙමළෙන් සටහන් කර ගැනීම සඳහා දෙමළ දන්නා නිලධාරියකු නොසිටීමේ ප්‍රශ්නය අවුල්වීමට හේතුවුණා.

ඒරාවූර් වාර්තාකරු පවසයි. කාත්තන්කුඩි භාෂා සංවර්ධන සමිතියේ සභාපතිනි සෞන්දර්යරාණි මහත්මිය පවසන්නේ ද, ඊට සමාන වූ කතාවකි.

ගමේ කෙනෙක් තමන්ට වෙච්ච අසාධාරණයක් ගැන දෙමළෙන් පැමිණිලි කළා. ලියා ගත්තේ සිංහලෙන්. තමන් අත්සන් කළේ මොනවද කියලා පැමිණිලිකරු දැනගෙන හිටියේ නැහැ. කිසිම පරීක්ෂණයක් කෙරුණෙත් නෑ. අන්තිමේදි අපි මැදිහත් වෙලා පැමිණිල්ල විධිමත්ව ලියලා ලියාපදිංචි තැපෑලෙන් ස්ථානාධිපතිට යැව්වා. යවලා සති තුනයි. පිළිතුරක් නෑ. සෞන්දර්යරාණි පවසයි. මෙබඳු සිදුවීම් ගණනාවක් අසන්නට ලැබුණේ මඩකලපුව ප්‍රදේශයේ දෙමළ ජනතාව මුහුණ දෙන භාෂාමය ගැටලු පිළිබඳව කෙරුණු කතා බහකදී ය. විදුහල්, රෝහල් යනාදි රජයේ ආයතන වල නාම පුවරු භාෂා දෙකින් ම ප්‍රදර්ශනය නොවීම රජයේ හා පෞද්ගලික ආයතනවල ලියුම්, චක්‍රලේඛ යනාදිය ඉංග්‍රීසි හෝ සිංහලෙන් පමණක් ප්‍රකාශයට පත් කිරීම, දෙමළ භාෂාව භාවිත කරන ප්‍රදේශ වල පැමිණිලි ලියා ගැනීම සඳහා දෙමළ බස දන්නා පොලිස් නිලධාරීන් නොසිටීම යනාදි තත්ත්වයන් නිසා ජනතාව මුහුණ දෙන ගැටළු මෙහිදී අවධානයට ලක් කෙරිණි.

**වෙඩිබෙහෙත් හා පුපුරණ ද්‍රව්‍ය**

භාෂා ප්‍රශ්නය මුල් කරගත් තිස් අවුරුදු යුද්ධයකට රට මුහුණ පෑවා. දැන් යුද්ධය අවසන්. එහෙත් කිසිවකු එය ජයගෙන නෑ. එය ජය ගැනීමට පටන්ගත යුත්තේ භාෂාව මුල් කරගෙනයි. තවදුරටත් පරිපාලන හෝ විධායක ක්‍රියා මගින් දෙමළ හෝ සිංහල භාෂාවන්ට වෙනස් කර සැලකීමක් වන්නේ නම් තවදුරටත් එය වෙඩිබෙහෙත් එකතු කිරීමේ ක්‍රියාවක් බවට පත් වෙනවා." පරිපාලනමය හෝ විධායක ක්‍රියාවක් වදනයක් නොකර හැරීමක් පුපුරණ ද්‍රව්‍ය බවට පත් වන්නේ එවිටයි.

පොදු ජනතාව මත මුදා හැරෙන භාෂා පීඩනය පුපුරායන ආකාරය පිළිබඳ වූ මේ විශිෂ්ට ප්‍රකාශය කරන ලද්දේ නීතිඥ ලේඛක එස්. ජී. පුංචිහේවා මහතා විසිනි.

රජයේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික භාෂා හා සමාජ ඒකබද්ධතා අමාත්‍යංශයක් පිහිටුවන ලද්දේ 2010.11.25 දා ය. මේ අමාත්‍යංශය පිහිටුවීමට පෙර රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරවීම සඳහා චක්‍රලේඛ කිහිපයක්ම නිකුත් කර ඇත. එම චක්‍රලේඛ වල සඳහන් පරිදි සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවකින් පිළිතුරු යැවියයුතු ය. එම භාෂාව පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ආදාළ නිලධාරියාට නැත්නම් පරිවර්තනයක් යැවිය යුතුම ය. චක්‍රලේඛ වැනි පොදු උපදෙස් භාෂා තුනෙන් ම නිකුත් කළ යුතුයි. අවශ්‍ය පහසුකම් තිබියදීත් ක්‍රියාත්මක වී නැත්නම් දඬුවමක් තිබිය යුතුම ය. පහසුකම් නැතිනම් රජය වගකිව යුතුයි.

මෙම චක්‍රලේඛ ක්‍රියාත්මක වීමේ මන්දගාමී ස්වරූපය මත නව අමාත්‍යංශයේ කාර්යභාරය වැදගත් විය. අමාත්‍යංශයේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ආයතන තුනක් පවතී. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, රාජ්‍ය භාෂා කොමිසම සහ ජාතික භාෂා පුහුණු ආයතනය (අගලවත්ත) යනු එම ආයතන තුනයි.

වාමාංශික දේශපාලඥයකු වශයෙන් සිටින වාසුදේව නානායක්කාර මහතාට එම අමාත්‍යංශය බාර දීම රජය විසින් ගන්නා ලද ඉතා නිවැරදි තීන්දුවකි. එමෙන්ම සෙමෙන් නමුත් වැදගත් වැඩ කොටසක් අමාත්‍යංශය මගින් ඉටු කරමින් තිබෙන බව ද පෙනේ. එහෙත් බිම් මට්ටමේ සිදුවීම්වලින් පෙනෙනුයේ ප්‍රජා ක්‍රියාකාරිත්වය කෙරෙහි දක්වා තිබෙන සැලකිල්ල මඳ බව වේ. බසයක නාම පුවරුව වෙනස් කිරීම වැනි සරල ක්‍රියාවන් පවා නොවන මට්ටමට ක්‍රියාන්විතය මන්දගාමී වී ඇති බව පෙනෙයි.

ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා විසින් පත් කරන ලද උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසම ඉදිරිපත් කර ඇති නිර්දේශ මෙහිදී අපගේ සැලකිල්ලට ලක්විය යුතු මතයයි.

එහි භාෂා ප්‍රතිපත්තිය යටතේ 9.239 වගන්තියෙහි දැක්වෙන්නේ වර්තමානයේදී පවා සුළු ජන කොටස්වල බොහෝ දෙනාට තමන්ගේ කටයුතු පවත්වාගෙන යෑමට සිදුව තිබෙන්නේ තමා තෝරාගත් භාෂාවෙන් නොවන බව ය.

එමෙන්ම භාෂා ප්‍රතිපත්තිය පූර්ණ වශයෙන් ක්‍රියාවට නැංවීමේදී ප්‍රජා මට්ටම දක්වා විහිදුණු ක්‍රියාකාරී සැලසුම් අන්තර්ගත කළ යුතුවාක් මෙන්ම වසම් සහ පළාත් පාලන ආයතන වලට අවශ්‍ය ලෙස අනාවරණය වන ප්‍රජා සහභාගිත්වයෙන් අධීක්ෂණය කළ හැකි ඉලක්ක තිබිය යුතු බව 9.241 වගන්තියෙහි දැක්වෙයි.

මේ නිර්දේශ ඉදිරිපත් කර ඇත්තේ ජාත්‍යන්තර කුමන්ත්‍රණකරුවන් නොවන බවත්, ජනාධිපතිවරයා විසින් පත් කරන ලද බුද්ධි මණ්ඩලයකින් බවත්, කොමිසමට විරුද්ධව පාරට බස්සන ලද, චීවරධාරීන් හා ඊනියා දේශප්‍රේමීන් හට සිහිපත් කළ යුතුයි.

තමා පදවාගෙන ගිය බස් රිය අනතුරට ලක්වීමේ සිද්ධියේ දී සුන්දරලිංගම් මහතාට පොලීසියෙන් සාධාරණය ඉෂ්ඨ නොවුනේ දෙමළ භාෂාව දත් පොලිස් නිලධාරියකුගේ සහාය ගැනීමේ අයිතිය ඔහුට අහිමි වූ නිසා වීම ය. එම අයිතිය ඔහුට අහිමි වූ නිසා වීම ය. එම අයිතිය ඉල්ලා සිටීම සහ එම අයිතිය වෙනුවෙන් හඬනගන පිරිස් අමතා තම දුක් ගැනවිල්ල ප්‍රකාශ කිරීම ජාත්‍යන්තර කුමන්ත්‍රණයක් වන්නේ කෙසේ ද? එය දමිළ ඩයස්පෝරාවට ඔක්සිජන් සැපයීමක් හැටියට අර්ථකතනය කිරීම යුක්ති යුක්ත ද?

නැඟෙනහිර පළාතෙහි ජන සංයුතිය බලන විට

▶



පෙනී යනුයේ දෙමළ, මුස්ලිම් සහ සිංහල ජනවර්ග තුනම සංඛ්‍යාව අනුව බොහෝ දුරට සමාන බව ය. එහෙත් දෙමළ සහ මුස්ලිම් යන ජනවර්ග දෙකම මව් භාෂාව හැටියට දෙමළ කතා කරන හෙයින් දෙමළ භාෂක සමාජය සුළුතරය බවටත් පත්වේ. එහෙත් රාජ්‍ය හා පුද්ගලික ආයතනවලින් තම සේවාවන් ඉෂ්ට කර ගැනීමට යන මහජනතාවට වීල්ල වන භාෂාමය පීඩනය තවමත් තුනී වී නොමැත.

මෑතකදී පිහිටුවන ලද නාම පුවරු භාෂා තුනෙන්ම මුද්‍රණය කර තිබීම ප්‍රශංසා කටයුතු ය. එහෙත් සුලබව දක්නට ඇත්තේ සිංහල සහ දෙමළ යන භාෂා දෙකින්ම සැකැසුණු පුවරු වෙනුවට තනි භාෂාවකින් මුද්‍රිත පුවරු ය. ඒවා එක්කෝ දෙමළ ය. එක්කෝ සිංහල ය. එසේ නැත්නම් සිංහල හා ඉංග්‍රීසි ය. දෙමළ කතා කරන සිංහල නිලධාරීන් හෝ දෙමළ නිලධාරීන් සෑම රාජ්‍ය ආයතනයකම සිටීම උතුරු නැගෙනහිරට අනිවාර්ය විය යුතු ය. පොතුවිල් මහජන බැංකුවේ සිංහල නිලධාරියෙක් නෑ. ලාහුගල සිංහපුර සහ උල්ල යන ප්‍රදේශවල පදිංචි සිංහල උදවිය බැංකුවෙන් ගනුදෙනු කරන්න ගියාම ප්‍රශ්නවලට මුහුණ දෙනවා. මේ ගැන වගකිවයුත්තන් හට දැනුම් දී තිබුණත් ප්‍රතිඵලයක් වී නැති බව ඒ අය කියනවා. ලාහුගල පදිංචිකරුවෙකු වන ගුණසේකර මහතා පවසයි.

සිංහල භාෂක සමාජය සුළුතරය බවට පත් වූ ප්‍රදේශයක ජනතාව මුහුණ දෙන භාෂා ප්‍රශ්නය එසේ ය. මේ පිළිබඳ ලන්ඩන් වාසී සිංහල ඩයස්පෝරාව කියන්නේ කුමක්ද? ලන්ඩන්වාසී එම ඩයස්පෝරාව මේ වන විටද උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ නිර්දේශ ජාත්‍යන්තර කුමන්ත්‍රණයක් බවට තම විරෝධය දක්වා ඇත.

කුමන්ත්‍රණ හීතිකාව අතහැර මහ පොළොවේ ඇති සැබෑ ප්‍රශ්නවලට සංවේදී වීමේ කාලය එළඹ ඇත.

**තිඹිරියාගම බණ්ඩාර**

# බැංකු ලියවිලි ඉංග්‍රීසියෙන්...

1 පිටුවෙන්

ශ්‍රී ලංකා මහ බැංකුව නියෝජනය කරමින් පැමිණ සිටින නිලධාරීන් කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රකාශ කර සිටින්නේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් බැංකු පනත යටතේ 2012. 10. 05 වන දින නිකුත් කරන ලද 2011 විධාන අංක 08 සහ එහි ඇමුණුම් 1 හි සඳහන් පාරිභෝගික ප්‍රඥප්තිය මගින් බැංකු වල සියලුම ගනුදෙනුකරුවන්ට තමන් කැමති භාෂාවකින් තොරතුරු ලබා ගැනීමේ අයිතිය තහවුරු කර ඇති බවත් ය.

එමගින් සියලුම බලපත්‍රලාභී බැංකු විසින් සිය ව්‍යාපාර කටයුතු හා සම්බන්ධ කරුණු අඩංගු ලේඛනයන්, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා ත්‍රිත්වයෙන් ම පවත්වා ගෙන යායුතු බවත් මහ බැංකුව බැංකු අධීක්ෂණ ක්‍රියාවලියේ දී මෙම විධානයන්ට අනුව කටයුතු කරන්නේ ද යන්න පිළිබඳව පරීක්ෂාවට ද ලක් කිරීම් සිදු කරන බවත් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

මේ අතර කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටින සියලුම බැංකු නියෝජනය කරන වග උත්තරකරුවන් ප්‍රකාශ කර සිටින්නේ මෙවැනි ආකාරයේ පැමිණිලි සෘජුවම පැමිණිලි කිරීමට නිසි අධිකාරියක් ක්‍රියාත්මක වන බැවින් ඉදිරියේ දී මෙවැනි පැමිණිලි රාජ්‍ය භාෂා කොමිෂන් සභාව වෙත යොමු කිරීමට හැකි බවයි.

කෙසේ වෙතත් පැමිණිලි පාර්ශවය එයට මුළුමණින්ම එකඟ වීම ප්‍රතික්ෂේප කරන ලද අතර, එම තත්ත්වය වඩා දීර්ඝ ලෙස පැහැදිලි කරදෙන ලදී. මීට පෙර ද රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ ඉදිරිපත් කරන ලද පැමිණිලි රාජ්‍ය භාෂා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් ඇති නමුත් එයින් කිසිදු ප්‍රගතිගාමී හා නිසි අධීක්ෂණ කටයුත්තක් සිදු නොවුන නිසා පැමිණිලි පාර්ශවය විසින් එම පැමිණිලි ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත නැවත ඉදිරිපත් කළ බව ද වැඩිදුරටත් ප්‍රකාශ කළේ ය.

HRC/3613/12, HRC / 3614/12 සහ HRC/3615/12, යන පැමිණිලි අංක යටතේ 2012-12-20 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ (අධීක්ෂණ හා සමාලෝචන) නීතිඥ තුසිතා සමරසේකර ඉදිරියේ දී පරීක්ෂණය පැවැත් වූ අතර වග උත්තරකරු නියෝජනය කරමින් බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ටී.එම්.ජේ.වයි.පී. ප්‍රනාන්දු මහත්මිය ද බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ එච්.එම්. ඒකනායක මහතා ද පැමිණ ඇත.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වෙනුවෙන් ප්‍රජා සහභාගිත්ව වැඩසටහන් අංශයේ සම්බන්ධීකාරක ලයනල් ගුරුගේ මහතා සහ පැමිණිල්ලේ නීතිඥ එස්.ජී. පුංචිහේවා යන මහත්වරු ද සහභාගී වී සිටියේ ය.

දෙපාර්ශවය විසින් ඉදිරිපත් කර ලද කරුණු සළකා බැලූ කොමිෂන් සභාව දෙපාර්ශවයන්ට පැහැදිලි කරන ලද්දේ මෙවැනි භාෂා පිළිබඳ ගැටළු සෘජුවම ඉදිරිපත් කිරීමට විශේෂ බලයක් ඇති අධිකාරියක් පිහිටුවා ඇති අතර මෙවැනි රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරවා ගැනීමේ හා අධීක්ෂණ කටයුතුවලට සෘජුවම බලපෑම් කළ හැකි ආයතනයට මෙවැනි පැමිණිලි ඉදිරිපත් කිරීම හා එයින් සහන ලබා ගැනීම වඩා කාලෝචිත හා නිවැරදි ක්‍රමවේදය බවයි.

මේ වන විට පැමිණිලි පාර්ශවය විසින් ගොනුකර ඇති භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කර ගැනීමේ පැමිණිලි හා මෙම පැමිණිල්ල ඉදිරියේ දී රාජ්‍ය භාෂා කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම සුදුසු යයි මානව හිමිකම් කොමිසම තීරණය කර ඇත.

කොමිසන් සභාවේ තීරණය හා එම අදාළ පිලිගොණු රාජ්‍ය භාෂා කොමිසම වෙත යොමු කිරීමට ද මානව හිමිකම් කොමිසම තීරණය කර ඇත.

# අම්පාරේ ජනමාධ්‍ය හා භාෂා...

4 පිටුවෙන්

දෙමළ බස දන්නා නිලධාරියකු මාර්ග යෙන් පරිවර්තනය කොට ඉදිරිපත් කිරීමේදී තමා සිංහල නොදන්නාකම බලවත් අසරණභාවයකට පත් වූ බව ඇය පවසයි. නගරයේ මංමාවත් සෑම බසකින්ම නම් කර තිබුණේ නම් තමාට පහසුවෙන්ම කච්චේරිය සොයා ගැනීමට හැකිවනු ඇති බවත් සිංහල නොදන්නා පුද්ගලයින් වෙනුවෙන් කච්චේරිය වැනි රාජ්‍ය ආයතන වල විකල්ප වැඩසටහනක් ක්‍රියාත්මක වූයේ නම් තමා මෙවැනි ගැටලුවකට මැදිහත් නොවන්න ඉඩ තිබුණ බවත් ඇය වැඩිදුරටත් පැවසී ය. තමා ජීවත්වන ප්‍රදේශයේදී මෙවැනි ගැටලුවලට මුහුණ නොදෙන බවද ඇය පැවසුවා ය.

අම්පාර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාශ පහක් තුළ ක්‍රියාත්මක වන සුළුජාතීන්ගේ භාෂා අයිතීන් රැකගැනීම සහ තහවුරු කිරීමේ ව්‍යාපෘතිය සාර්ථක ප්‍රතිපල පෙන්වා ඇතැයි වාර්තා වේ. අක්කරපත්තුව, සමන්තුර, කල්මුණේ, පොතුවිල්, ලාහුගල යන ප්‍රදේශවල භාෂා සමිති 30 ක සාමාජිකයන් හමුවී අප කළ විමසුමකදී ඒ බව තහවුරු විය.

ලාහුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාශයේ ලාහුගල උතුර ග්‍රාමසේවක වසමේ පදිංචි එම්. ස්වර්ණා මෙසේ පැවසුවා ය. "අපේ ප්‍රදේශයේ ලංකා බැංකුවේ හිටිය ඔක්කොම සේවකයින් දෙමළ සහ මුස්ලිම්. සිංහල කතා කරන නිලධාරීන් කවුරුවත් හිටියේ නෑ. සිංහල අයට ඒක ලොකු ප්‍රශ්නයක් වුණා. CPA සංවිධානය මැදිහත් වුනාට පස්සෙ දැන් එක සිංහල මහත්තයෙක් අපේ රාජකාරි කටයුතුවලට සහය වෙනවා.

අම්පාර පළාත් අධ්‍යාපන කාර්යාල බල ප්‍රදේශයට අයත් අම්/පරණගොව්පල කණිෂ්ඨ විද්‍යාලය සහ අම්/ලාහුගල මහා විද්‍යාලය හඳුන්වාදෙන නාමපුවරු සිංහල භාෂාවෙන් පමණක් ප්‍රදර්ශනය කිරීමෙන් ගැටලු මතුවී ඇති බව පරණ ගොව්පල භාෂා ප්‍රවර්ධන සමිතිය පවසයි. එම ප්‍රදේශයේ ජන අනුපාතය දෙමළ ජනතාව සියයට පනහක් වන අතර සිංහල ජනතාව සියයට පනහකි. පරණගොව්පල කණිෂ්ඨ විද්‍යාලයේ ළමුන් හැටක්ද, ලාහුගල මහ විද්‍යාලයේ ළමුන් දහසකට අධික පිරිසක් ද අධ්‍යාපනය ලබන බව සඳහන් වේ.

එසේම කණිෂ්ඨ විද්‍යාලයේ දෙමළ ගුරුවරයකු නොමැතිකමින් සිසුන් විශාල පිරිසකට ගැටලු මතු වී ඇති බව පරණ ගොව්පල භාෂා ප්‍රවර්ධන සමිතියේ සභාපතිනී මුත්තිලිංගම් විජයලක්ෂ්මි මහත්මිය ප්‍රකාශ කළා ය.

මෙම ප්‍රදේශයට විදේශ සංචාරකයින් පැමිණෙන නමුත් ඔවුන්ට ද ප්‍රදේශය පිළිබඳ දැනගැනීමට මෙම දැන්වීම් පුවරු ගැටලුවක් වී ඇති බවද ඇය පැවසුවා ය. මේ පිළිබඳව ප්‍රදේශයේ රාජ්‍ය නිලධාරීන් වාචිකව දැනුවත් කර ඇති බවද සභාපතිනී මුත්තිලිංගම් විජයලක්ෂ්මි මහත්මිය වැඩිදුරටත් සඳහන් කළා ය.



**රාජ්‍ය සේවය ද්විභාෂාකරණය හමුවේ ඇති අවස්ථා හා අභියෝග පැහැදිලි කරමින් මෙම ලිපිය ඉදිරිපත් කරන්නේ රාජ්‍ය භාෂා කොමිසමෙහි හිටපු සභාපතිවරයකු වන රාජා කොල්ලුරේ මහතා ය. මෙහිලා රජය මුහුණ දෙන ප්‍රධාන අභියෝගයක් වන්නේ මානව සම්පත් හිඟය බව ඔහුගේ අදහසයි. ජාතික වශයෙන් බලන විට දෙමළ ජාතිකයන්ගේ ප්‍රතිශතයට සමගාමීව දෙමළ බස භාවිත කරන රජයේ සේවකයන් ප්‍රමාණයක් නොසිටීම මීට ප්‍රධාන හේතුවක් බව ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සමීක්ෂණ තොරතුරු ඇසුරෙන් ඔහු පසුගිය කලාපයේදී පැහැදිලි කළේ ය. මෙවර පළවන්නේ එහි දෙවැනි කොටසයි.**

# භාෂා පුහුණුව විධිමත් කළ යුතුයි



*රාජා කොල්ලුරේ*

පෙර සඳහන් කරන ලද වගු දෙකේදීම ප්‍රාදේශීය සභා අංශය සැලකූ කල්හි එය අනෙකුත් අංශ දෙකට වඩා පරිපාලන ඉහළ මට්ටමකින් ඇති බව පෙනේ. මෙසේ වන්නේ උතුරු නැගෙනහිර පළාත්වල පරිපාලන කටයුතු දෙමළ භාෂාවෙන් කරගෙන යන අතර මෙම ප්‍රදේශවල දෙමළ භාෂා ප්‍රවීනත්වයෙන් යුත් රාජ්‍ය සේවකයන් ගේ සංඛ්‍යාව වැඩි බැවිනි.

2006 සමීක්ෂණයට සාපේක්ෂව (2001. 8.32% ලෙස පැවති 15.7% දක්වා ඉහළ නැග ඇත.) සමස්ත දෙමළ කතා කරන රාජ්‍ය සේවකයින්ගේ ප්‍රමාණය වැඩි වීමක් පෙන්වයි.

**දෙමළ භාෂා ප්‍රවීණත්වයක් දක්වන සේවකයින්ගේ හිඟය මගහැරීම.**

දෙමළ භාෂාව කෙරෙහි ප්‍රවීනත්වයක් දක්වන රාජ්‍ය සේවකයන්ගේ හිඟය හැකි ඉක්මණින් මගහරවා ගත යුතු තත්ත්වයකි. දෙමළ බස කතා කරන පුද්ගලයන් රාජ්‍ය සේවයට බඳවා ගැනීම වර්ධනය කළ යුතු බව අප පවසන්නේ එබැවිනි.

රාමුපිල්ලෙහි සිද්ධියෙන්[4]. [4]රාමුපිල්ලෙයිට එදිරිව රාජ්‍ය පරිපාලන, ප්‍රාදේශීය සභා හා අභ්‍යන්තර කටයුතු අමාත්‍ය ෆෙස්ටස් පෙරේරා හා සෙසු අය ශ්‍රේෂ්ඨාධිකරණයේදී සුළු ජාතික සාමාජිකයකුගෙන් සමන්විත හත් දෙනෙකුගෙන් යුත් ජූරි සභාව විසින් දක්නා ලද අන්දමට ඉහළ තනතුරක් වෙනුවෙන් වන තෝරා ගැනීමකදී සුළු ජාතිකයන්ට හිමි වී තිබූ කෝටා ප්‍රමාණය යන සාධකය මත දෙමළ ජාතිකයෙක් වූ රාමුපිල්ලෙයිගේ ජ්‍යෙෂ්ඨත්වය හා විශිෂ්ඨ සේවාව නොසලකා හැර තිබුණි. මේ අනුව පෙනී යන්නේ රාජ්‍ය සේවයේදී ජාතිකත්වය අනුව කෝටා ක්‍රමයක් මත යැපෙමින් උසස්වීම් ලබා දීම නිසා 12 වගන්තියෙන් අවධාරණය කොට දක්වා ඇති වගන්තිය උල්ලංඝනය වන බවයි. පසුව මේ හා සම්බන්ධව විවිධ නීතිමය කරුණු පැන නැඟුණු බව රාජ්‍ය භාෂා කොමිසම දැන සිටියි. කෙසේ වෙතත් පරිපාලනයේ අත්‍යවශ්‍ය කටයුතු සඳහා සුදුසුකම් ලත් සේවකයින් බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම සිද්ධිය අදාළ කරගත හැකි නොවේ. දෙමළ කතා කරන පිරිසට සිය කටයුතු පහසුවෙන් කරගත හැකි ආකාරයෙන් රාජ්‍ය සේවයට අතිරේක සේවයක් හඳුන්වා දීමට රාජ්‍ය භාෂා

> "සිය රාජකාරී කටයුතු සාර්ථකව කරගෙන යා හැකි මට්ටමින් රාජ්‍ය සේවකයන්ට දෙවන රාජ්‍ය භාෂාවේ ප්‍රවීණත්වයක් ලබා දීම තුළින් ද ද්වි භාෂිකව රාජ්‍ය සේවාව පවත්වාගෙන යාමට හැකිවන අන්දමට මානව සම්පත් වර්ධනය කරගැනීමට පුළුවන."

කොමිෂන් සභාව යෝජනා කරයි. රාජ්‍ය සේවය සඳහා තෝරා ගැනෙන තරඟ විභාග සිංහල හා දෙමළ යන මාධ්‍ය දෙකෙන්ම පැවැත්වුවද කිසියම් හෝ හේතුවක් නිසා දෙමළ භාෂා මාධ්‍යය අඩු තරඟකාරී බවක් පෙන්වයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස දෙමළ බස කතා කරන අයවලුන් රාජ්‍ය සේවාවට බඳවා ගැනෙන්නේ අඩුවෙනි. මෙම තත්ත්වය දෙමළ භාෂාවෙන් සිදුවන රාජ්‍ය සේවා කටයුතුවලට බලපෑම් කිරීම එතරම් හොඳ තත්ත්වයක් නොවේ. අතිරේක රාජ්‍ය සේවයක් ලෙස දෙමළ බසින් කටයුතු සිදු කිරීම වැනි බරපතල ක්‍රියාමාර්ග ගැනීමට සිදු වන්නේ මෙබැවිනි.

සිය රාජකාරී කටයුතු සාර්ථකව කරගෙන යා හැකි මට්ටමින් රාජ්‍ය සේවකයන්ට දෙවන රාජ්‍ය භාෂාවේ ප්‍රවීණත්වයක් ලබා දීම තුළින් ද ද්වි භාෂිකව රාජ්‍ය සේවාව පවත්වාගෙන යාමට හැකිවන අන්දමට මානව සම්පත් වර්ධනය කරගැනීමට පුළුවන.

රාජ්‍ය භාෂා කොමිසමේ 2005 නිර්දේශ ගිවිසුමට අනුව රාජ්‍ය සේවයේ නියුතුව සිටින අයවලුන් සඳහා වන මට්ටම් තුනක භාෂා පුහුණුව හඳුනා ගැනිණි.

1. කථනයේ ප්‍රවීණත්වය (පරිපාලන මට්ටමේ කටයුතු කෙරෙන වෛද්‍යවරුන් හා හෙදියන් වැනි වෘත්තිකයන්)
2. කථනයේ හා ලිඛිත භාෂාවේ ප්‍රවීනත්වය (කළමනාකරණ සහකාර වැනි තනතුරු වල සේවය කරන්නවුන් සඳහා)
3. කථනය හා ලේඛනය යන අංශ දෙකෙන්ම මනා ප්‍රවීණත්වය (පරිපාලන හා විධායක ශ්‍රේණියේ වෘත්තිකයන් සඳහා)

2007 ආරම්භයේ සිට රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ විෂය මාලාව රාජ්‍ය භාෂා කොමිසම මගින් ප්‍රවීණ වාග්විද්‍යාඥයකු වන මහාචාර්ය සුසින්දරාජා (යාපනය විශ්ව විද්‍යාලයේ විශ්‍රාපක මහාචාර්ය) මහතාගේ ප්‍රධානත්වයෙන් යුතුව විශේෂඥ මණ්ඩල දෙකක සහභාගිත්වයෙන් ඉහත දැක්වූ පළමු මට්ටම් දෙකට දෙමළ බස ඉගැන්වීම සඳහා පෙළ පොත් දෙකක් සම්පාදනය කර ඇත. පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ මහාචාර්ය එස් තිල්ලෙයිනාදන් හා විවෘත විශ්ව විද්‍යාලයේ දෙමළ භාෂාව පිළිබඳ ආචාර්ය අබේසිංහ ජයකොඩි මහතා මෙම මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයන් වේ. රජයේ සේවකයන්ට දෙමළ බස උගැන්වීමට හා මට්ටම් වලට අනුකූලව ඔවුන්ගේ දෙමළ භාෂා හැකියාවන් ඇගයීමට ලක් කිරීමේ කාර්ය පැවරී ඇති රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව දැනට මෙම පෙළ පොත් භාවිත කරයි.

**රාජ්‍ය සේවකයන්ට භාෂා පුහුණුව ලබා දීම.**

දිනෙන් දින වර්ධනය වන ඉල්ලුමට අනුව රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවට භාෂා පුහුණුව ලබා දීම යන සුවිශාල කාර්යයේ ඵලදායී ලෙස යෙදීමට තරම් අවශ්‍ය මානව සම්පත් නොමැති බව රාජ්‍ය භාෂා කොමිසම විසින් සොයා ගෙන ඇත. ප්‍රාදේශීය සභා තුළ භාෂා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව රාජ්‍ය භාෂා කොමිසම විසින් අවධාරණය කරන්නේ එබැවිනි. කෙසේ වෙතත් රාජ්‍ය භාෂා කොමිසම නිරීක්ෂණය කර ඇති අන්දමට ප්‍රාදේශීය සභා

*14 පිටුවට*

# භාෂා අයිතිය සහ මනුස්සකම

## ශිෂ්‍ය රචනා තරඟය


### භාෂා අයිතීන් විෂයයට අදාළව රචනාවක් ලියා ත්‍යාගයක් දිනාගන්න

මව් කුසින් බිහි ව ලොව එළිය දකින කුඩා දරුවාට පළමුව දැනෙන සුවඳ කිරි සුවඳයි. දරුවා වැඩෙන්නේ මව් කිරෙහි පෝෂණයෙනි. ඊළඟට දරුවාගේ සවන වැකෙන්නේ නැලවිලි ගීයේ සරයෙන් හදවතට දැනෙන මව් බසයි. මව් බස ඔස්සේ දරුවා අදහස් හුවමාරු කරගනී. තමන් අයත් සංස්කෘතිය හඳුනා ගනී. ශිෂ්ටත්වය වගා කර ගනී. එසේ හෙයින් ළමා වියෙන් පටන් ගෙන, තරුණ විය හා මැදිවිය පසු කොට මහලු විය ඉක්මවා මිය යන තෙක් සෑම පුද්ගලයකු හට ම මව් බස මව් කිරි තරම් ම හෝ ඊටත් වඩා වැදගත් වේ. මේ අනුව බැලූ විට තම මව් බස භාවිත කිරීමට බාධා පැමිණෙන පුද්ගලයකුට ඇති වන වේදනාව, ඉච්ඡා භංගත්වය හා කළකිරීම අමුතුවෙන් විස්තර කළ යුතු නොවේ.

කරුණු එසේ හෙයින් මව් කිරි සේ උතුම් වූ තම මව් බස තමන්ගෙන් අහිමි කරනු ලැබීම හෝ ඊට සීමා මායිම් වැට කඩොලු ඇති කිරීම තම අයිතිවාසිකම් උදුරා ගැනීමකි. සුසංවේදී ජීවිතයක් ගත කිරීමේ මිනිස් අභිලාසයන්ට නිගරු කිරීමකි.

මේ පිළිබඳව ඔබට හැඟෙන්නේ මොනවා ද? ඔබේ මව් බස කතා කිරීමේ අයිතිය ඔබෙන් උදුරා ගනු ලැබුව හොත් ඔබට ඇති වන වේදනාව කෙබඳු විය හැකි ද? භාෂා අයිතිය නොසලකා හැරීමේ වේදනාව, විනාශකාරී ගැටුමක් දක්වා දුර දිග යා හැකි බව ලොව බොහෝ රටවල අත්දැකීම් අනුව පෙනේ. ගැටුම හා ඝාතනය වෙනුවට, සහජීවනය සහ අවිහිංසාවෙහි ඇති වැදගත්කම පිළිබඳ තව දුරටත් විවාදයක් තිබිය නොහැක.

මෙසේ හෙයින් මව් බස, එහි වැදගත්කම සහ එය අහිමි වීමෙන් අත්වන වේදනාව පිළිබඳ ඔබට ද අදහසක් තිබිය හැකි ය. ඒ අදහස් සාරවත් නම්, එය මිනිස් සමාජය වඩා යහපත් සමාජයක් බවට පත් කිරීමට හේතු වේ නම් ඔබට අවස්ථාවක් ලබාදීමට සූදානම් ය.



**මෙම රචනා තරඟය උතුර සහ නැගෙනහිර පළාත්වල අ.පො.ස සා/පෙළ හා උ/පෙළ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට විවෘත අතර භාෂාව සහ මිනිස්කම තේමා කරගනිමින් ඔබ ලියන රචනය වචන 750-1000 ක අතර විය යුතුය. එය ඒ4 ප්‍රමාණයේ කඩදාසි වල තනි පැත්තක පමණක් ලිවිය යුතුය. රචනා භාරගන්නා අවසාන දිනය 2013 මාර්තු 01 වන අතර ඒ සඳහා යෝජිත මාතෘකා වන්නේ.**

1. ශ්‍රී ලංකාවේ ජනවාර්ගික ප්‍රශ්නය සහ භාෂා අයිතිවාසිකම්
2. භාෂා අයිතීන්ද මානව හිමිකම් වේ
3. භාෂා අයිතීන් සහ ජනවර්ගයන් අතර අවබෝධය
4. සංස්කෘතික විවිධත්වයේ මූලිකාංගයක් ලෙස භාෂා අයිතීන්
5. භාෂා අයිතීන්ට ගරු කිරීම

**දිස්ත්‍රික් මට්ටමින් තෝරා ගන්නා ජයග්‍රාහී නිර්මාණ 5ක් සඳහා වටිනා තෑගි**

1 වැනි ත්‍යාගය : 7,500/=, 2 වැනි ත්‍යාගය : 6,000/=, 3 වැනි ත්‍යාගය : 5,000/=,
4 වැනි ත්‍යාගය : 3,000/=, 5 වැනි ත්‍යාගය : 2,000/=,

සමග සහතික පත් පිරිනමනු ඇත.
6 සිට 10 ස්ථානය දක්වා සහතික පිරිනැමේ.

**වැඩිදුර විස්තර සහ ඔබගේ රචනා ඉදිරිපත් කිරීම සඳහා ලිපිනය**

වැඩසටහන්භාර නිලධාරි / විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
105, 05වැනි පටුමග, කොළඹ - 03

පාසල් ශිෂ්‍යයන්ගේ රචනා තම විදුහල්පතිවරුන් විසින් සහතික කළයුතු අතර ඔබගේ රචනා එවනු ලබන කවරයේ වම් පස ඉහළින් "රචනා තරඟය" යයි සඳහන් කරන්න.

ඔබේ බස ඔබට සොඳුරු ය. මිහිරි ය. එය ඔබ රකිති. ඔබට ශික්ෂණය ලබා දෙයි. ඔබට එහි ඇති වැදගත්කම අන්‍ය භාෂා කතා කරන පුද්ගලයන්ට ද ඒ බස සම්බන්ධයෙන් සර්ව සාධාරණ ය. අපි ඒ අයිතියට ගරු කරමු !

*විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රජා සහභාගීත්ව වැඩසටහන් අංශයේ මෙහෙවරකි*

# භාෂා පුහුණුව..

12 පිටුවෙන්

මෙම වැඩසටහන් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වී ඇත.

අනෙක් අතට සිය භාෂා පුහුණු වැඩසටහන් නිසියාකාරව පවත්වාගෙන යෑම සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවට හා රාජ්‍ය භාෂා කොමිසමට ප්‍රමාණවත් තරම් අරමුදල් සපයා නොමැත. (පොලිස් නිලධාරීන්ට හා සෞඛ්‍ය සේවයේ නියුතු වූවන්ට භාෂා පුහුණුව ලබා දීම මෙයට ඇතුළත් වේ.)

2005 රාජ්‍ය භාෂා කොමිසම මගින් කරන නිර්දේශයන්ට අනුව රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව දිවයිනේ විවිධ ප්‍රදේශවල විසිරුණු ශාඛා ජාලයක් සහිත ස්වාධීන ආයතනයක් බවට පත් කරන සේ කෙරුණු ඉල්ලීමක්ද වෙයි. එමගින් දිවයිනේ විවිධ ප්‍රදේශවල රාජ්‍ය භාෂාව මෙන්ම සම්බන්ධක භාෂාවද වඩාත් ඵලදායි ලෙස ඉගැන්වීමේ හැකියාව ලැබෙනු ඇත. අනෙක් අතට අධ්‍යාපන ආයතනයක් විසින් ඉටු කළ යුතු කාර්යභාරය දෙපාර්තමේන්තුවකට පවරා තිබීම එක්තරා ආකාරයකට නුසුදුසු සේ පෙනී යයි.

ෆෙඩරල් මට්ටමින් ද්විභාෂික පරිපාලනයක් ඇති කිරීමේ කාර්යයේ නියුතුව සිටින කැනඩාවෙන් උගත හැකි දේ බොහෝ ය. රාජ්‍ය සේවකයන්ට පූර්ණකාලීනව දෙවන රාජ්‍ය භාෂාවේ[6] ([6]මෙහිදී දෙවන රාජ්‍ය භාෂාව යන යෙදුමින් සිංහල මාධ්‍යයෙන් බඳවා ගත් අයට දෙමළ බසත් දෙමළ මාධ්‍යයෙන් බඳවා ගත් අයට සිංහල බසත් යන්න අදහස් වේ.) ප්‍රවීනත්වයක් ලබා දෙන අධ්‍යාපන ආයතන කැනඩාවේ ෆෙඩරල් රජය මගින් ස්ථාපිත කර ඇත. මේ ආකාරයේ ක්‍රමයක් මෙහිදී ද අනුගමනය කිරීමෙන් සෑම වසරකම මෙවැනි වැඩසටයනක් යටතේ රාජ්‍ය සේවකයන්ට දෙවන රාජ්‍ය භාෂාව පිළිබඳ නිසියාකාර අවබෝධයක් ලබා දිය හැකි බව අපගේ හැඟීමයි.

අලුතින් බඳවා ගනු ලබන සේවකයන්ට මෙන් ම දැනට රාජ්‍ය සේවයේ යෙදී සිටින සේවකයන්ට දෙවන රාජ්‍ය භාෂා පුහුණුව ලබා දීම කල් ගතවන කටයුත්තකි. සෑම වසරකම රාජ්‍ය සේවකයන්ගෙන් 4% - 5% පමණ ප්‍රමාණයක් විශ්‍රාම යෑම හෝ සේවය කිරීම අවශ්‍ය වේ. අපගේ ගණනය කිරීම් වලට අනුව මෙම ප්‍රතිපත්තිය ඉතාම විශ්වාසදායක සේ පවත්වාගෙන ගියත් ද්විභාෂික ප්‍රවීණත්වයකින් යුත් රාජ්‍ය සේවයක් බිහි කිරීමට නම් අවම වශයෙන් වසර විස්සක්වත් ගතවනු ඇත. මෙයට ආදේශයකයක් වසර දහයකින් සැපයිය හැකිවනු ඇත.

**පරිවර්තනයන් හා වාචික පරිවර්තනයන්**

පරිවර්තනය හා වාචික පරිවර්තනය වැනි ක්ෂණිකව මතුවන ගැටලු සඳහා ගත හැකි පියවර මොනවාද? පරිවර්තකයන් සම්බන්ධයෙන් වන ගැටලුව පහත දැක්වෙන වගුවෙන් වඩාත් හොඳින් පැහැදිලි කර දැක්විය හැකි ය.

මෙම ගැටලුව විසඳීමට ප්‍රවේශයන් දෙකක් දැක්විය හැකි ය. ඉන් එකක් වන්නේ අවශ්‍ය අයවලුන්ට නිසි පුහුණුව ලබා දීමයි. අනෙක් විසඳුම වන්නේ දැනට සිටින ප්‍රවීණයන් ගෙන් උපරිම සේවය ලබා ගැනීමයි.

පරිවර්තකයන් හා වාචික පරිවර්තකයන් පුහුණු කිරීමේ කාර්යයෙහි ලා වඩාත්ම සුදුසු බවට අප යෝජනා කරන්නේ විශ්ව විද්‍යාල ක්ෂේත්‍රයයි. විශ්ව විද්‍යාලවල පවතින සම්පත් මගින් මෙම පුහුණු කිරීම නිසියාකාර ලෙස කරගෙන යා හැකි වේ. අප තවදුරටත් යෝජනා කරන්නේ සිංහල ඉංග්‍රීසි හා දෙමළ භාෂා පාඨමාලා පවත්වාගෙන යන විශ්ව විද්‍යාල ඒවා තවත් භාෂාවක් හා සම්බන්ධ කර රැකියා ඉලක්ක කරගත් පාඨමාලා සේ ඉදිරිපත් කළ යුතු බවයි.

> “ෆෙඩරල් මට්ටමින් ද්විභාෂික පරිපාලනයක් ඇති කිරීමේ කාර්යයේ නියුතුව සිටින කැනඩාවෙන් උගත හැකි දේ බොහෝ ය.”

දෙවන පියවරක් ලෙස ජාතික පරිවර්තන මධ්‍යස්ථානයක් ස්ථාපිත කර (2006 රාජ්‍ය භාෂා කොමිසමේ නිර්දේශ) පරිවර්තනයන් විද්‍යුත් මධ්‍යවලින් (විද්‍යුත් තැපෑල හා පිටපත ලබා ගැනීම කළ හැකි ය. ඉන්පසු ආයතනයට මෙම පරිවර්තනයන් ඇගයීමකට ලක්කර සුදුසු වෙනස්කම් සිදුකළ හැකි ය. සියලුම අමාත්‍යංශ මෙන්ම දෙපාර්තමේන්තුවලට අවශ්‍ය පරිවර්තකයන් ඒකරාශී කිරීමේ කාර්ය මෙමගින් සිදුවනු ඇති. මෙම ආකෘතියක් කැනඩාවේ පරිවර්තන බියුරෝවෙන් ලබා ගත හැකි ය.

**පාසල් වල සිංහල හා දෙමළ ඉගැන්වීම.**

දීර්ඝ කාලීන සැලැස්මක් සේ ද්විතියික පාසල්වල ඉංග්‍රීසි භාෂාවට අමතරව සිංහල හා දෙමළ අනිවාර්ය විෂයයක් බවට පත් කිරීම ද රාජ්‍ය භාෂා කොමිසම මගින් යෝජනා කර ඇත. මෙම යෝජනාව ස්ථාපනය කළහොත් තව වසර දහයක දොළහක කාලයක් ඇතුළත පරිවර්තන හෝ වාචික පරිවර්තන අවශ්‍ය නොවන පරම්පරාවක් බිහිවනු ඇත.

**භාෂා විගණනය**

භාෂා ප්‍රතිපත්තිය ස්ථාපිත කර ඇති ආකාරය විමර්ෂණය කිරීම සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් භාෂා විගණන වැඩසටහන් පවත්වාගෙන යනු ලැබේ. කෙසේ වෙතත් මෙම ක්‍රියාමාර්ගය එතරම් ඵලදායී වී නැත්තේ අප විගණනය සිදු කළ සියලුම ආයතන වලින් අසන්නට ලැබුණේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ස්ථාපනය කිරීම සඳහා ස්වදේශීය කටයුතු හා රාජ්‍ය සේවා අමාත්‍යංශය මගින් පුහුණු කටයුතු සිදු කිරීමට අවශ්‍ය දෙවන රාජ්‍ය භාෂාවේ[7]. ([7]මෙහිදී දෙවන රාජ්‍ය භාෂාව යන යෙදුමින් සිංහල මාධ්‍යයෙන් බඳවා ගත් අයට දෙමළ බසත් දෙමළ මාධ්‍යයෙන් බඳවා ගත් අයට සිංහල බසත් යන්න අදහස් වේ.) ප්‍රවීණතාවයක් ඇති සම්පත් පුද්ගලයන් ලබා දී නොමැති බවයි. අනෙක් අතට සලකා බලන විට අමාත්‍යංශය සතුවත් සුදුසු මානව සම්පත් නොමැති බවත් එනම් දෙමළ බස පිළිබඳ ප්‍රවීණත්වයක් ඇති සම්පත් පුද්ගලයන් බඳවා ගැනීම හෝ ප්‍රමාණවත් සංඛ්‍යාවලින් පුහුණු කිරීම හෝ සිදු නොවේ.

**දැනුවත් කිරීමේ වැඩසටහන්**

රාජ්‍ය භාෂා කොමිසම මගින් දියත් කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් යම්තාක් මට්ටමකට ඵලදායිබවක් පෙන්වයි. මේ බව පැහැදිලි වූයේ මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් මගින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ස්ථාපනය කිරීමේ වැදගත්කම අවධාරණය කිරීමට හැකිවීම නිසා ය. මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් තුළින් භාෂා පුහුණු වැඩසටහන් සඳහා (විශේෂයෙන්ම දෙමළ) රාජ්‍ය සේවකයින් විශාල සංඛ්‍යාවක් බඳවා ගෙන ඇත. එමෙන්ම මෙම දැනුවත් කිරීමේ වැඩසටහන්වලින් පසුව බොහෝ රාජ්‍ය සේවකයන් දෙවන රාජ්‍ය බසින් රාජකාරි කිරීමේ වැදගත්කම අවබෝධ කරගත් බවද රාජ්‍ය භාෂා කොමිසමට හැඟී ගොස් ඇත.

**භාෂා අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම.**

භාෂා අයිතීන් උල්ලංඝනය වීම පිළිබඳව ද රාජ්‍ය භාෂා කොමිසම කටයුතු කරයි. එහෙත් ලැබෙන පැමිණිලි සංඛ්‍යාව සුළු ප්‍රමාණයකි. මෙයින් අදහස් වන්නේ තත්ත්වය යහපත් බව නොවේ. භාෂා අයිතීන් උල්ලංඝනය වූ පුද්ගලයෙක් ඒ පිළිබඳව පැමිණිලි කිරීමට වඩා සිය කටයුත්ත කෙසේ හෝ කර ගැනීමට උනන්දු වෙයි. රාජ්‍ය භාෂා කොමිසම මගින් සොයා ගෙන ඇති ආකාරයට සිංහල භාෂාවෙන් කටයුතු කළ නොහැකි පුද්ගලයන් බොහෝ විට තුන්වැන්නන් (මුදල් ගෙවා) ලවා සිංහල භාෂාවෙන් ලියුම් කියුම් කටයුතු කර ගැනීම මෙන්ම වාචික පරිවර්තන සඳහා ද සිංහල දන්නා අයෙකුගේ සහාය ලබා ගැනීම සිදු කරයි. තමාට සිදුවන අසාධාරණයන් පිළිබඳව පැමිණිලි කිරීමට රාජ්‍ය භාෂා කොමිසම හැමවිටම මහජනයා උනන්දු කරවයි. සිය මැදිහත් වීමෙන් කිහිප වතාවක් මේ පැමිණිලි සිදු කිරීමට රාජ්‍ය භාෂා කොමිසම සමත් වී ඇත.

**නිගමනය**

මේ සියලු කරුණු සලකා බැලීමෙන් පෙනී යන්නේ ශ්‍රී ලංකාව තුළ භාෂා අයිතිවාසිකම් තහවුරු කිරීම සංකීර්ණ කාර්යයක් බවයි. මෙම කාර්ය සඳහා අවශ්‍ය නීතිමය කටයුතු සම්පාදනය කර ඇතත් අවශ්‍ය මානව සම්පත් දක්නට නොවේ. මෙය ගැටලුවේ කේන්ද්‍රය ලෙස පවතියි. මෙය විසඳාලිය හැක්කේ සෘජු බඳවාගැනීම් හා භාෂා පුහුණුව තුළින් පමණි. මේ සියල්ල කල් ගත වන කටයුතු වේ. කැනඩාවේ ද්විභාෂාකරණ ක්‍රියාවලිය සඳහා දැනටමත් වසර හතලිහක කාලයක් ගත වී ඇත. රාජ්‍ය භාෂා කොමිසම මගින් ඉදිරිපත් කෙරුණු නිර්දේශයන් යුහුසුළුව ස්ථාපිත කර ගැනීමෙන් ශ්‍රී ලංකාවට වසර පහළොවකටත් අඩු කාලසීමාවකින් ද්විභාෂික පරිපාලන හැකියාව ලබා ගත හැකි වනු ඇත.

# අලුත් අවුරුද්දේ වෙනස්කම් රැසක් සිදුවෙනවා...

7 පිටුවෙන්

**ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වන බව ප්‍රකාශ වුවත් එහි සාර්ථකත්වය පිළිබඳව සෑහීමකට පත්විය හැකි ද? ඔබතුමන්ලා මේ ගැන පසුවිපරමක් කරනවාද?**

රාජ්‍ය ආයතනවල භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට යාමේදී අපි තේරුම් ගත් එක් දෙයක් තමයි ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට තිබෙන මූලික අවශ්‍යතාවයන් කීපයක් ඉටුවී නැති බව. සමහර ආයතනවලට අවශ්‍ය මුදල් නැහැ. දැනුම නැහැ, ඒ වගේම නීත්‍යානුකූලභාවයක් නැහැ. උදාහරණයක් ලෙස ගත්තොත් පසුගිය වසර තුළ දුම්රිය නිවේදන කටයුතු ත්‍රෛභාෂාවෙන් සිදු කිරීමට අපි උත්සාහ ගත්තා ඒත් මෙහිදී අපි තේරුම්ගත් එක දෙයක් තමයි කොයිතරම් දැඩි අවශ්‍යතාවයක් තිබුණත් දුම්රිය නිවේදන කටයුතු බාර නිලධාරියෙකු එහි නොමැති බව කිසිම පුද්ගලයකුගේ රාජකාරි ලැයිස්තුවට මෙය ඇතුළත් නොවීම ගැටලුවක් උනා. දුම්රිය නිවේදන කටයුතු කරන්නෙ එම දෙපාර්තමේන්තුවෙ ඉන්න පහළම සේවකයා. එතකොට අපි කළේ එම සේවකයින්ට දෙමළ භාෂාව පිළිබඳව සම්පූර්ණ පුහුණුවක් ලබා දීමට කටයුතු කිරීමයි. ඉතා කෙටි පාඨමාලාවක් කොළඹ විශ්ව විද්‍යාලයේ මහාචාර්ය අබේසිංහ මහතාගේ සම්බන්ධීකරණයෙන් ආරම්භ කළා. දැනට සියයකට අධික පිරිසක් ඒ මගින් සේවයට යොදවා තිබෙනවා. ඔවුන් හොඳින් එය ප්‍රයෝජනයට ගෙන නිවේදන කටයුතු කළා. එහෙත් ගැටලුව වන්නේ, මේ පුහුණු සේවකයින්ට පවා තවත් රාජකාරි පැවරී තිබීමයි. එනම් නිවේදන කටයුතුවලට අමතරව තවත් රාජකාරි කටයුතුවල තම දෛනික සේවා කාලයේදී නිරත වීමට ඔවුනට සිදුවී තිබෙනවා.

මෙහි තියන ප්‍රධාන ගැටලුව තිබෙන්නේ පරිපාලන කටයුතු සම්බන්ධවයි. මේ සඳහා රාජ්‍ය පරිපාලනයට අදාළ ආයතනවල සහය ගැනීමට සිදුවී තිබෙනවා. "දුම්රිය නිවේදක" නමින් තනතුරක් ඇති කිරීම මෙහිදී ප්‍රධාන අවශ්‍යතාවයක් වුණා. දෙසැම්බර් 31 පසු සියලුම මඟී ගමනාන්ත පුවරු ත්‍රෛභාෂාවෙන් තිබීම අනිවාර්යයි. එම නීතිය උල්ලංඝනය කරන පුද්ගලයන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට කටයුතු සලසා තියෙනවා.

මේ අතර සියලුම බැංකුවල ලිපි ලේඛන ත්‍රෛභාෂාවෙන්ම සකස් කිරීමත් අනිවාර්ය කෙරෙනවා. ලංකාවේ සියලුම රාජ්‍ය බැංකුවට මෙය බලපාන අතර පසුව පෞද්ගලික බැංකුවලටද ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වෙනවා.

**මෙම කටයුතු ඉදිරියට පවත්වාගෙන යාම සඳහා භාෂා කොමිසම සතු බලතල ප්‍රමාණවත් යැයි ඔබ සිතනවා ද?**

ලංකාවේ පොලිසිය සහ අධිකරණ කොපමණ තිබුණත් අපේ රටේ සිදු වෙන වැරදිවල අඩුවක් නැහැ. ඒවා ප්‍රවාහයක් ලෙසින්, සිදුවෙමින් තිබෙනවා. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේදී මම දකින්නෙ අපිත් නීතිය ක්‍රියාත්මක කිරීම මගින් පමණක් මේ ප්‍රයත්නයට විසඳුම් සෙවීම ප්‍රමාණවත් නැති බවයි. භාෂා ප්‍රතිපත්ති උල්ලංඝනය කරන්නවුන් හඹා යන නීතිය ක්‍රියාත්මක කරන ආයතනයක් බවට පත්වීමෙන් පමණක් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සාර්ථකව ක්‍රියාත්මක කළ නොහැකි බව මගේ අදහසයි. ප්‍රධාන වශයෙන් අවශ්‍ය වන්නේ මේ රටේ සිංහල, දෙමළ ජනතාව තුළ ආකල්පමය වෙනසක් ඇති කිරීමයි. මේ සඳහා පසුබිම සකස් වී තියනවා. නමුත් සම්පත් මදිකමක් තියනවා. කාලයක් තිස්සේ මේ පිළිබඳ නොතකා හැරීම නිසා භාෂා දෙකම දන්නා අයගේත් අඩුවක් තිබෙනවා. මූලික වශයෙන්ම බැලුවොත් රාජ්‍ය භාෂා කොමිසමට අද තියෙන තත්ත්වයට වඩා බලතල තිබිය යුතුයි. කම්කරු, රේගු, වැනි දෙපාර්තමේන්තුවල ඔවුන්ගේ නියෝගයන් කඩකරන පුද්ගලයන්ට එරෙහිව ඔවුන්ටම පැමිණිලිකරු වෙලා පැමිණිලි කළ හැකියි.

ඒ සඳහා ඉතා කෙටි ක්‍රමවේදයක් තියෙනවා. එවැනි ක්‍රමවේදයක් රාජ්‍ය භාෂා කොමිසමට ලැබෙනවා නම් මීට වඩා ඉක්මනින් සහ සමීපව රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්න අපිට මැදිහත් වෙන්න පුළුවන්. එක්තරා විදියක අර්ධ අධිකරණමය බලයක් අපට ලැබෙනව නම් මීට වඩා සමීප බලපෑමක් කළ හැකි වෙනවා. මේ සියලු දේ සලකා බැලුවත් ද්වි භාෂාව ක්‍රියාත්මක කිරීමේදී වඩාත් වැදගත් වෙන්නේ පුරවැසියන් තුළ තිබෙන ආකල්පමය සාධකයි. එසේම සියලු රාජ්‍ය, පෞද්ගලික මාධ්‍යයන්ගේ සහ රාජ්‍ය ආයතනවල සහය විශාල වශයෙන් මේ සඳහා අවශ්‍යව තියනවා.

**පසුගිය 28 වෙනි දා ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යංශය මගින් භාෂා ගැටලු කඩිනමින් විසඳීම සඳහා 1956 යන ක්ෂණික ඇමතුම් මධ්‍යස්ථානයක් ආරම්භ කළා. එහි ක්‍රියාකාරීත්වය කෙසේ ද?**

එය ඉතා හොඳ පියවරක්. භාෂා ප්‍රතිපත්තිය උල්ලංඝනය වූ විට එය විඳදරාගෙන සිටීමට තමයි පුරවැසියන් පුරුදු වෙලා තිබුනෙ. ඔවුන් දැනගෙන හිටියෙ නැහැ මෙය අයිතියක් බව සහ මේ සඳහා භාෂා කොමිසමට පැමිණිලි කිරීමට පුළුවන් බව. ඒ සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයට වුණත් යා හැකිය යන දැනුවත්කම ජනතාවට දැනිල තිබුනෙ නැහැ. මේ සඳහ ක්ෂණිකව මැදිහත් වීමට අවස්ථාවක් ලබා දීම පුරවැසියන්ගේත් පැත්තෙන් ගනු ලැබූ යෝධ පියරවක්.

**අවසාන වශයෙන් 2013 වසරේදී රාජ්‍ය භාෂා කොමිසමේ බලාපොරොත්තු කවරේදැයි පැහැදිලි කළ හැකි ද?**

2013 වසර වන විට උගත් පාඩම් කොමිසමේ නිර්දේශවලට අනුව ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ රාජ්‍ය පරිපාලන අමාත්‍යංශයත් සමග අපි සාකච්ඡාවක් පැවැත්වුවා. එහි දී අපි වැදගත් තීරණයක් ගත්තා. ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට ද්විභාෂා තනතුරක් ඇති කිරීම ඒ අනුව අපි කටයුතු කරනවා.

ද්විභාෂා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 71 හඳුනාගෙන තියෙනවා. එයින් 42 මේ වන විට ගැසට් කර අවසන්ව තියෙනවා. රාජ්‍ය පරිපාලන ලේකම්වරයා පොරොන්දු වුණා මූලික වශයෙන් ඒ ද්විභාෂා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 71 තුළ මෙම තනතුර ඇති කිරීමට. 2013 වසරේදී මේ සඳහා අවශ්‍ය පියවර ගන්නවා.

මේ අතර උප්පැන්න හා මරණ, විවාහ යන සහතික ද්වි භාෂාවෙන්ම නිකුත් කිරීමට බලය ලබාදෙන්නත් පියවර ගැනීමට 2013 වසරේ බලාපොරොත්තු වෙනවා.

ඊට අමතරව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය අතර ඇති හොඳම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තේරීමේ තරඟාවලියේ දී 2013 වසරේ සිට රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳවත් අවධානය යොමු කරනවා. ඒ පිළිබඳව දැනුවත් කිරීම් කටයුතු දැනටම සිදුවෙමින් තිබෙනවා. ඉදිරි වසර සඳහා එය තවත් හොඳ ආරම්භයක් වේ යැයි අපි සිතනවා.

# භාෂා අයිතිය අහිමි කිරීම..

5 පිටුවෙන්

අතරම අනෙක් ජාතීන්ගේ භාෂා අයිතීන් පිළිගැනීමත් වැදගත් වෙනවා.

මා සිතන ආකාරයට භාෂා දෙකෙන්ම එකිනෙකා හා සංනිවේදනය කිරීමට හැකිවීම තරම් හොඳ ආකාරයක් තවත් ඇත්තේ නැහැ. මෙම තත්ත්වය ඇතිකර ගැනීමට ශ්‍රී ලංකාවේ අපට භාෂා දෙකෙන්ම එකිනෙකා හා කතා කිරීමට නොහැකි වන්නේ ඇයි දැයි කීමට කිසිදු හේතුවක් මට පෙනෙන්නේ නෑ. ඒ වගේම එසේ කතා කරමින් තමන්ගේ අනන්‍යතාවය, එකිනෙකාට වෙනස් වූ බව සහ තමන්ගේම වූ භාෂාවට ඇති ගෞරවයත් නොවෙනස්ව තබාගැනීමට නොහැකි වන්නේ ඇයි දැයි කීමට හේතුවක් ද මට පෙනෙන්නේ නෑ.

භාෂා අයිතීන් සාක්ෂාත් වන බව සහතික කිරීමේ දී තමන් විසින් පිළියම් යෙදිය හැකි හා එසේ කළයුතු බරපතල ප්‍රශ්නයක පවතින බව රජය විසින් පිළිගැනීම ඉතාමත්ම වැදගත් වෙනවා. ඒ නිසා තමයි ජනතාව සහ ජනමාධ්‍යයන් අතර සම්බන්ධයක් තිබීම වැදගත් වන්නේ. භාෂා අයිතීන් සම්බන්ධයෙන් සාමාන්‍ය ජනතාව මුහුණපාන ගැටලු දන්වා සිටින්නට හෙලිදරව් කරන්නට හැකිවන්නේ ජනමාධ්‍යයන්ටයි. ඒ මගින් කළයුතු වන්නේ කුමක් ද සහ කළ හැකි වන්නේ කුමක් ද යනාදිය පිළිබඳව සංවාදයක් ඇතිකළ හැක්කේ ද ජනමාධ්‍යයන්ටයි.

අවසාන වශයෙන් මා ඔබගෙන් ඉල්ලා සිටින්නේ, සමාජය සමග සම්බන්ධ වී, ජනමාධ්‍ය සමග සම්බන්ධ වී එදිනෙදා ජීවිතයේදී ම භාෂා අයිතීන්ට ගරුකරන ලෙසයි. ඔබගේ මව්බසට ගරු කිරීමටත් අන් අයගේ භාෂා අයිතීන් හට ගරු කිරීමටත් ඇති අවස්ථාව අතහැර දමන්න එපා. ඔබ මේ රටේ හොඳ අනාගතයක් ගොඩනැගීමට ක්‍රියා කළ යුතුයි. වඩාත් වැදගත් ලෙස කිවහොත්, ඔබගේ දරුවන්ට මේ රටේ හොඳ අනාගතයක් හිමිවිය යුතුයි. වඩාත් වැදගත් ලෙස කිවහොත් ඔබගේ දරුවන්ට මේ රටේ හොඳ අනාගතයක් අවශ්‍යවන මට්ටමට භාෂා අයිතීන්ට දිගින් දිගටම ගරු කරනු ඇතැයි මම හිතනවා.



# භාෂා අයිතිය ගමින් ගමට




ද්වි භාෂාවෙන් සමන්විත ශාන්ත අන්තෝනි දෙව්මැදුර දැක්වෙන නාම පුවරුව (පොතුවිල් ප්‍රදේශය)

ද්විභාෂා ප්‍රතිපත්තියේ ජයග්‍රහණයන් තහවුරු වන්නේ භාවිතය මතය. එහෙත් සමහර භාෂා අයිතීන් තවමත් පොතට පමණක් සීමා වී තිබෙනු දක්නට ලැබේ.

එම තත්ත්වය වෙනස් කරමින් ප්‍රායෝගිකව භාෂා අයිතිය තහවුරු කිරීමේ වැඩසටහන් අම්පාර දිස්ත්‍රික්කය තුළ මේ වන විට ක්‍රියාත්මක වෙමින් තිබේ. උතුරු නැගෙනහිර පළාත මූලික කොටගෙන විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ක්‍රියාත්මක කර ඇති සුළුතර ජාතිකයන්ට ප්‍රජාවන් භාෂා අයිතීන් ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන මේ සඳහා මගපෙන්වමින් සිටී.

මෙම ඡායාරූපයෙන් දැක්වෙන්නේ අම්පාර දිස්ත්‍රික්කය තුළ විවිධ නාමපුවරු සහ වෙළඳසල් මිල ගණන් දැක්වීම සඳහා භාෂා දෙකම යොදා ගැනීමට ඔවුන් පුරෝගාමීත්වය ගෙන ඇති ආකාරයයි. ප්‍රදේශයේ විවිධ ප්‍රජා සංවිධාන සමග එක්ව මෙම ද්විභාෂා නාමපුවරු ඉදිකිරීමට ඔවුහු ක්‍රියා කළහ.










භාෂා තුනෙන්ම මිළ ගණන් දැක්වීම (පොතුවිල් / උල්ල ප්‍රදේශ)




භාෂා ගැටලු ඉදිරිපත් කිරීමේ ක්ෂණික අංකය ඇතුළත් නාම පුවරුව පොතුවිල් ප්‍රදේශයේ දක්නට ඇති අයුරු (පොතුවිල් ඔරලෝසුකණුව ප්‍රධාන වටරවුම)




උල්ල සිංහපුර සමුදුගිරි විහාරය සහ අම්පාර සිංහපුර සිංහල විදුහල් නාම පුවරුව ද්විභාෂාවෙන් දැක්වෙන අයුරු




ලාහුගල ඓතිහාසික මඟුල් මහා විහාරය ද්විභාෂාවෙන් සමන්විත නව නාම පුවරුව




පානම ශ්‍රී සීලරතන දහම් පාසල් නාම පුවරුව ද්වි භාෂාවෙන් ඉදිකර ඇති අයුරු




භාෂා සංගම් අනුග්‍රහයෙන් ඉදිකළ නව නාම පුවරුව. (ශ්‍රී මහින්දාරාම විහාරය කුරුල්ලන්පොකුණ පානම ප්‍රදේශය)




අංපිටි දේවාලයේ නාම පුවරුව භාෂා විවිධත්වය ප්‍රදර්ශනය කරමින්

Printed by: Globe Printing Works, No.5 Stork Place, Colombo 10. Tel: 0777315971